# රට හදන හැටි..



# හෘදසාක්ෂියේ සම්මුතිය

"සතුටින් සිටිය හැකි රටක්"

**ජනතා විමුක්ති පෙරමුණ**

**අපේ දේශයේ හෘදසාක්ෂිය**

# හෘදසාක්ෂියේ සම්මුතිය

## පාර්ලිමේන්තු මැතිවරණය - 2015

## රට හදන හැටි

**ජනතාව සහ ජනතා විමුක්ති පෙරමුණ**
**සැකසූ රට නංවන වැඩ පිළිවෙල**

**(සාරාංශගත මුද්‍රණය)**

*“සතුටින් සිටිය හැකි රටක්”*

**ජනතා විමුක්ති පෙරමුණ**
**අපේ දේශයේ හෘදසාක්ෂිය**

# පටුන

| | පිටුව |
|---|---|
| අරමුණක් ඇති අධ්‍යාපනයක් | 5 |
| නිරෝගීමත් රටක්- සවිමත් සෞඛ්‍ය සේවාවක් | 8 |
| සැමට රැකියා දීමට හැකියාවක් | 11 |
| සිහිනයක් නොවන නිවසක් | 19 |
| ජනතාවාදී ආණ්ඩුවක්, ප්‍රියමනාප රාජ්‍ය සේවයක් | 22 |
| ‘වංචා, දූෂණ, මත්කුඩු, අපරාධ’ නැත - නීතිය සැමට සාධාරණ වනු ඇත. | 23 |
| කෘෂිකර්මාන්තයට පෝෂණයක්- ධීවර කර්මාන්තයට ප්‍රබෝධයක් | 27 |
| පරිසරයට රකෂණයක් | 32 |
| කාලයත් පහසුවත් රැකදෙන ප්‍රවාහනයක් | 33 |
| ඉන්දියානු සාගරයේ සංචාරක පාරාදීසය හදමු | 35 |
| සියල්ලන් දිනවන ක්‍රීඩාවක් | 38 |
| කලාවට වින්දනයක් - සංස්කෘතියට පෞරුෂයක් | 39 |

# වචනයක්

2015 ජූලි 22වැනි දින කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාගංණයේ පැවති ජනතා විමුක්ති පෙරමුණේ විශේෂ සමුළුවේදී 'හෘදසාක්ෂියේ සම්මුතිය' නම් වූ ජාතික වැඩපිළිවෙළ එළිදක්වනු ලැබිණි. පිටු 90කින් යුතු වූ එම වැඩපිළිවෙළ ඇතුළත් ලියවිල්ලෙන් මේ මොහොතේ, එනම් 2015 මහ මැතිවරණය අබියස, ජනතාව පෙළන ප්‍රධානතම ගැටලු සඳහා වන විසඳුම් ඇතුළත් කොට සහ ජනතාවට වැදගත්ම කොටස් උපුටා ගනිමින් මෙම සාරාංශගත මුද්‍රණය සකස් කරනු ලැබ ඇත.

අප රටේ ජනතාව මුහුණදී සිටින දැවෙන ප්‍රශ්න පිළිබඳව අවබෝධය ඇති, එම ගැටලු විසඳීමට අවශ්‍ය දැක්මක්, ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළක් ඇති, ඒවා ක්‍රියාවට නැඟීමට සමත් නායකත්වයක් ඇති, ඔබ වෙනුවෙන් සටන් කරන, ඔබ වෙනුවෙන් හඬනඟන, ඔබේ හඬ එනම් ජනතාවගේ හඬ බවට පත්විය හැකි ජනතා විමුක්ති පෙරමුණේ ජයග්‍රහණය වෙනුවෙන් මෙම මැතිවරණයේදී ඔබේ දායකත්වය ලබා දෙන මෙන් දැඩි සහෝදරත්වයෙන් ඉල්ලා සිටිමු.

ඔබේ හෘදසාක්ෂිය අවදි කරන්න!

සීනුවට ඡන්දය දෙන්න!!

**ජනතා විමුක්ති පෙරමුණ**

**අපේ දේශයේ හෘදසාක්ෂිය**

**වසර 2035 දී මේ බිම මත මිලියන 25ක ජනතාවක් !!!**
**එය රටට බරක් නොවන මඟක්**

1975 දී ශ්‍රී ලංකාව යනු මිලියන 13ක ජනතාවගේ වාසභූමිය විය. 1995 වන විට එය මිලියන 18 දක්වාද, 2015 දී මිලියන 21ක් දක්වාද වර්ධනය විය.

එක් වසරකදී මෙරට සිදුවන දරු උපත් ගණන 360,000 කි. වාර්ෂික මරණ සංඛ්‍යාව 140,000කි. මේ අනුව...

වසරක් පාසා මේ රටේ ජනගහණය
220,000 බැගින් වර්ධනය වන්නේය.

එසේනම් ඉන්දියානු සයුරෙන් වටවූ, ලෝක සිතියමේ තිතක් වන්, ශ්‍රී ලංකාව නැමැති පුංචි දිවයිනට වසර 2035දී මිලියන 25ක ජනතාවක් දරා සිටීමට සිදුවනු ඇත.

මෙය රටට බරක් වනු ඇතිද?

**දුර දකී නම්, මනා සැලසුම් තිබේ නම්, අවංකව ක්‍රියාවේ යෙදේ නම් 2035 දී මිලියන 25ක 'මානව සම්පත' රටේ සමෘද්ධියේ සැබෑ ශක්තිය වනු ඇත.**

**මෙලෙස ලියැවෙන්නේ, සතුටින් සිටිය හැකි රටක් වෙත ඔබ රැගෙන යන, රට හදන හැටි කියැවෙන, දේශයේ හෘද සාක්ෂියයි.**

# අරමුණක් ඇති අධ්‍යාපනයක්

වයස අවුරුද්දේ සිට අවුරුදු 4 දක්වා වන මේ රටේ දරුවන් මිලියනයට, සිය පූර්ව ළමාවිය සැබෑ ලෙසින්ම සංවර්ධනය කරන පෙර පාසල් පහසුකම් හෝ සැබෑ සුරැකුමක් ලබාදෙන දිවා සුරැකුම් මධ්‍යස්ථාන පහසුකම් නොමැත. මේ අතරවාරයේ අද උපන් දරුවාගේ සිට පෙර පාසල් අවසානය දක්වා වයසේ වන දරුවන් ලක්ෂ 14 කගේ දෙමාපියන් පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ වෙහෙසකාරී ‘පොරයට’ අර අඳිමින් සිටියි.

පාසල් අධ්‍යාපනයට අවස්ථාව හිමිවුවද ඒ අතුරින් දරුවන් 60,000ක් 10 වැනි ශ්‍රේණිය දක්වා පැමිණෙන අතරවාරයේ පාසල් අධ්‍යාපනයෙන් ‘හැලී යන’ රටකි මෙය. ඒ අනුව මෙරට වෙසෙන සෑම දරුවන් 6 දෙනෙකුගෙන්ම එක් අයකු, 10 වැනි වසරට පෙර පාසල් හැරගිය අයෙකු වන්නේය. සුදුසුකම් ලත් ගුරු හිඟයද දරුවන්ට පාසල් අධ්‍යාපනය එපාවීම සඳහා විශේෂයෙන් බලපාන්නකි. පුහුණු ගුරුවරුන්ගේ හිඟය නැමැති ගැටලුවට, සැටලයිට් රූපවාහිනී තාක්ෂණය ඔස්සේ දුරස්ථ ඉගැන්වීමේ ක්‍රමවේදය සරළ හා සාර්ථක විසඳුමකි. නමුත් මෙවැන්නක් ගැන මෙතෙක් කිසිදු අවධානයක් යොමුව නැත්තේය. මෙවැනි හේතු නිසා අනාගතය සොයා පාසල් අධ්‍යාපනයට පිවිසෙන පිරිස අතරින් දුසිමක්, දෙකක්, සියයක්, දහසක් නොව වසරකට ලක්ෂයක් සාමාන්‍ය පෙළ විභාග කඩඉම පරාජයට පත්වෙති.

උසස් පෙළ කඩඉම පැනගන්නා සිසු දරුවන් 125,000ක් දෙනා අතරින් 25,000ක් පමණක් නිදහස් අධ්‍යාපනයේ සරසවි වරම හිමිකර ගනිද්දී මේ රටේ වසරකට තවත් ලක්ෂයක් දෙනා සිය අනාගත අධ්‍යාපන ගමන තීරණය කරගත නොහැකි අවිනිශ්චිත භාවයකට පත්වෙති. මෙරට විශ්වවිද්‍යාල පද්ධතිය වෙනුවෙන් වසරක වියදම රුපියල් මිලියන 41,000කි. නමුත් වසරකදී විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදරා එයින් පිටව යන සිසුන්ගේ සංඛ්‍යාව 25,000කි. ඒ අනුව මෙරට විශ්වවිද්‍යාල අධ්‍යාපනයේදී එක සිසුවකු වෙනුවෙන් රුපියල් මිලියන 1.6ක් වැයකරයි. එසේ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අධ්‍යාපන අවස්ථාව ලබන පිරිසෙන් 65%ක්ම කාන්තාවන් වූවද මෙරට ශ්‍රමබලකායේ කාන්තා දායකත්වය 35%ක් පමණකි.

එය එසේ වෙද්දී අපි තවත් පැතිකඩක් ඔබට මෙසේ පෙන්වා දෙමු. ලෝකයේ අනෙක් සාර්ථක රටවල අධ්‍යාපනය සඳහා කෙරෙන වියදමෙන් වැඩි කොටසක් වැය කරනුයේ පෙර පාසල් අධ්‍යාපනය වෙනුවෙනි. නමුත් රටට අවැසි පුරවැසියකු බිහිකිරීමේ පළමු පියවර ලෙසින් අතිශයින් අවධානය යොමුවිය යුතු මෙම පෙර පාසල් අධ්‍යාපනය, ශ්‍රී ලංකාවේ නොසලකා හැර ඇති ක්ෂේත්‍රයක් බවට පත්ව තිබීම දුක්ඛිතය. දරුවෙකු කුසට ආ මොහොතේ පටන් ඒ දරුවා තරුණ අවධියට පත්වන තුරුම මේ රටේ දෙමාපියන් ලක්ෂ සංඛ්‍යාත පිරිසක් මුහුණදෙන මේ 'අධ්‍යාපන අසහනය' මෙන්ම මේ රට භාර ගැනීමට සිටින පරපුරට මුහුණදීමට සිදුව ඇති මේ 'අධ්‍යාපන ඛේදවාචකය'ට අපේ විසඳුම් මෙසේ වන්නේය.

- අධ්‍යාපනයේ සම අයිතිය මූලික අයිතිවාසිකමක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කෙරේ. සෑම පුද්ගලයෙකුටම පුද්ගල දක්ෂතා සහ ජාතික අවශ්‍යතා මත පදනම්ව අඛණ්ඩ අධ්‍යාපනයක්, පුහුණුවක් සහ උසස් අධ්‍යාපනයක් ලබා දීම රජය මගින් තහවුරු කෙරේ.
- අධ්‍යාපනය සඳහා කරනු ලබන වියදම අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් ලෙස වෙන් කෙරේ. මෙම ප්‍රතිපාදන අධ්‍යාපනයේ සම අයිතියත්, එහි ගුණාත්මක භාවයත්, අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් වර්ධනය කිරීමත් අරමුණු කර ගනිමින් යෙද වේ.
- පෙර පාසල් අධ්‍යාපනය රජයේ වගකීමක් කොට සලකා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත්කරන අතර විද්‍යාත්මක පදනමක් මත ඒවා ප්‍රමිතිකරණය කර ගුරුවරියන් දැනුමෙන් සහ කුසලතාවයන්ගෙන් පොහොසත් කිරීමටත් සියලු පෙර පාසල් අත්‍යාවශ්‍ය පහසුකම්වලින් සංවර්ධනය කිරීමටත් පියවර ගැනේ.
- මෙම ක්‍රියාවලිය සම්පූර්ණ වනතෙක් ක්ෂණික අවශ්‍යතාවයක් ලෙස සලකා පෙර පාසල් සංවර්ධනය කිරීම සඳහා ලක්ෂ 03 ණය මුදලක් ලබා දේ.
- පෙර පාසල් අධ්‍යාපනය ද ඇතුළු අධ්‍යාපනය සඳහාම වෙන් වූ රූපවාහිනී නාලිකාවන් ආරම්භ කෙරේ.
- චන්ද්‍රිකා තාක්ෂණය යොදා ගනිමින් ගුරු පුහුණු වැඩසටහන්, පෙර පාසල් ගුරුවරියන් අතරට ගෙන යාමත්, ඔවුන් ඇගයීම පිණිස විභාග

ක්‍රමයක් සකස් කර සහතික පත් පිරිනැමීමටත් අදාළ විභාගයෙන් සමත්වන සහතිකලාභී ගුරුවරියන්ට දිරි දීමනාවක් ලෙස රු. ලක්ෂ 02 ක මුදලක් පිරිනැමීමත් සිදු කෙරේ.

- ප්‍රාථමික පාසල් උසස් ප්‍රමිතියට පත් කිරීමේ ප්‍රධාන අරමුණ ඇතිව දැනට ඇති ප්‍රාථමික පාසල්වලින් වසරකට පාසල් 500 බැගින් තෝරා ගෙන පාසල් අතර ඇති දුර, දරුවන්ගේ අධ්‍යාපනික සාධනය, යන නිර්ණායක මත වසර 05 තුළ දී ප්‍රාථමික පාසල් 2500 ක් සඳහා පරිඝනක ගොඩනැගිල්ලක්, ක්‍රීඩා සංකීර්ණයක්, ළමුන් 250කට පහසුකම් සහිත නව දෙමහල් ගොඩනැගිල්ලක්, ඉහළ මට්ටමේ වැසිකිලි පද්ධතියක් සහ දන්ත හා ළමා සෞඛ්‍ය සායනයක් ලබා දේ.
- නිපුණතාවන්ට බල නොපාන පරිදි ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ට නිවසේ දී හෝ බාහිර පන්ති මගින් කිරීමට සිදුවන අධ්‍යාපන කටයුතු අවමකර දරුවන්ගේ සමාජ ජීවිතය ඉහළ නැංවීමටත් දෙමව්පියන්ට විඳීමට සිදුවන අවහිරතා අවම කිරීමටත් පියවර ගැනේ. ඒ යටතේ 1, 2, 3 වසරවල දරුවන්ට ගෙදර වැඩ (Home Work) ලබා දීම නතර කිරීමට යෝජනා කෙරේ.
- පාසල් අධ්‍යාපනය ලබන සියලුම දරුවන්ට නොමිලේ පාසල් පොත්, නිල ඇඳුම් සහ පෝෂ්‍යදායක දිවා ආහාරයක් සැපයේ.
- සෑම සරසවි සිසුවකුටම රජය මගින් නොමිලේ ලැප්ටොප් පරිගණකයක් ලබා දේ.
- නවීන අධ්‍යාපනයේ මූලික ලක්ෂණයක් වී ඇති සෑම සිසුවකුටම පරිඝණකයක් ලබාදීම හා පංති කාමර ඩිජිටල් තාක්ෂණයෙන් යුත් ඒවා බවට පත් කිරීම අනාගතය සඳහා අත්‍යාවශ්‍ය නවීකරණයකි. මේ සඳහා පළමු වසර තුළ පාසල් 100 ක පංති කාමර 500 ක්ද වසර පහ තුළ දී පාසල් 1000 ක පංති කාමර 5000 ක් ඩිජිටල්කරණය කිරීමට කටයුතු කෙරේ.
- සියලු පෙළ පොත් අන්තර්ජාලය හරහා පරිශීලනය කිරීමට පහසුකම් සලසා දේ.
- පාසල් ප්‍රවාහන සේවා විධිමත් සහ ආරක්ෂාකාරී කිරීම සඳහා නීතිමය තත්වයන් සහ තාක්ෂණික සහායන් ලබා දීමට කටයුතු කෙරේ.

- පාසල් සිසුන් ප්‍රවාහනය සඳහා යොදා ගන්නා බස් රථ සහ වෑන් රථ ආනයන බද්දෙන් නිදහස් කෙරේ.
- පාසල් වල ජාතික භාෂාවන් තුනෙන්ම (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි) විෂයන් ඉගැන්වීමට අවශ්‍ය සියලු පහසුකම් සැපයේ.
- ගුරු හිඟය සහ ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් විද්‍යාත්මක අධ්‍යනයක් සිදු කර ගුරු හිඟය සහ අකාර්යක්ෂමතාව නැති කිරීමට පියවර ගැනේ. ඒ සඳහා ආරම්භයක් ලෙස දුෂ්කර පාසල්වල සේවය කරන ගුරුවරුන්ට වැටුපට අමතරව මූලික වැටුපෙන් 50%ක දීමනාවක් ලබා දේ.
- උසස් පෙළ සමත් වන සියලු සිසුන්ට විශ්ව විද්‍යාලයට ඇතුල් වීමේ පහසුකම ලබා දීම ඉලක්ක කර ගනිමින් විශ්ව විද්‍යාල පද්ධතිය පුළුල් කෙරේ.
- සියලු සරසවි සහ උසස් අධ්‍යාපන ආයතනවල ආචාර්යවරුන්ට සහ අනධ්‍යන කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට නේවාසික පහසුකම් ලබා දීමට කටයුතු කෙරේ. සරසවි ආචාර්ය හිඟයට හා බුද්ධි ගලනයට විසදුමක් වශයෙනුත් වැඩි පිරිසක් සරසවි ආචාර්යවරුන් ලෙස බඳවා ගැනීමේ අරමුණිනුත් වාර්ෂිකව 10% කින් වැඩිවන පරිදි ස්ථිර කථිකාචාර්යවරයෙකුගේ ආරම්භක වැටුප රුපියල් ලක්ෂයක් බවට පත් කෙරේ.
- ශ්‍රී ලංකාවේ සරසවිවල වාර්ෂිකව ඉහළම සාමාර්ථ ලබන සිසුන් 500කට විදේශීය දියුණු විශ්ව විද්‍යාල සමග ඇතිකර ගන්නා රාජ්‍ය ගිවිසුම් මගින් පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමේ.

## නිරෝගිමත් රටක් - සවිමත් සෞඛ්‍ය සේවාවක්

ජීවයෙන් පිරුණු රටක් ගොඩනැගීමට නම් රටවැසියාගේ ජීවය රැකීම අත්‍යවශ්‍යය. නමුත් මේ රටේ ජනතාව ජීවයෙන් යුතුව ජීවත්වන්නේද?

'ඉන්දියන් සාගරයේ මුතුඇටය', 'ලෝකෙන් උතුම් රට යැයි' හැඳින්වූ මේ රට අද කායිකව මෙන්ම මානසිකවද රෝගී වෙමින් පවතින රටකි. ලොව සතුටින් සිටින රාජ්‍යයන් නැමැති ලැයිස්තුවේ

ශ්‍රී ලංකාවට හිමිවන්නේ 137 වැනි ස්ථානයයි. මේ අනුව අපි ලෝකයේ අසතුටින්, අසහනයෙන්, ආතතියෙන් සිටින රටවල් අතර මුල් තැනක සිටීම කණගාටුදායකය. ලෝකයේ ආයු අපේක්ෂා ගණනයන් අනුව 84 වැනි ස්ථානයට වැටී ඇති ශ්‍රී ලංකාව, ලෝකයේ ශීඝ්‍රයෙන් මිනිසුන් මියයන රටවල් කිහිපය අතරටද එක්ව තිබීම ඛේදජනකය.

ලක්ෂ 200ක ජනගහනයක් සිටින මේ රටේ රෝහල්වල නේවාසිකව ප්‍රතිකාර සඳහා ඇතුළත්වීම් ලක්ෂ 60ක්ද, බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ගැනීම් ලක්ෂ 500ක්ද වසරක කාලයක් තුළ වාර්තා වේ. සතුන් හපාකෑම් හෝ සර්ප දෂ්ඨනයන්ට ලක්ව දිනකට 1000ක් පමණ පිරිසක් රෝහල් ගතවන අතර ඒ අනුව මේ රටේ 365,000ක් තරම් විශාල පිරිසක් ඒ අයුරින් ආපදාවට ලක්වේ. රට වෙලාගනිමින් පවතින ව්‍යසනයක් බවට පත්ව ඇති වකුගඩු රෝගය විසින් මේ රටේ අප අතරින් 2500ක් දෙනා එක වසරකදී මරණයට පත්කරනු ලබයි. මෙවන් දෑ වැළැකීමට අප ගන්නා විසඳුම් මෙසේය.

- එළඹෙන වසර 5 ඇතුළත සෑම පුද්ගලයෙකුටම රජය වෙනුවෙන් වගකියන පවුලේ වෛද්‍යවරයෙකුගේ ආවරණය ලබාදෙන අතර, අවම වශයෙන් වසරකට වරක් පූර්ණ වෛද්‍ය පරීක්ෂණයකට ලක් කෙරේ.
- දැනට අවුරුදු 75 ක් වන ශ්‍රී ලාංකිකයින්ගේ ආයු අපේක්ෂා කාලය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනේ.
- දැනට බහුල වශයෙන් ව්‍යාප්තව තිබෙන රෝගාබාධ සහ අනතුරු කඩිනමින් පාලනය කිරීම සඳහා ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර ඒ යටතේ ජලභීතිකාව සහ ඩෙංගු රෝගය වසර 3 ක් තුළ මුළුමනින්ම තුරන් කිරීමට පියවර ගැනේ.
- රාජ්‍ය අංශයේ අත්‍යවශ්‍ය ඖෂධ, උපකරණ සහ පරීක්ෂණ පහසුකම් හිඟය සහ ප්‍රමිතියක් නොමැති වීමේ තත්වය වසර 5 ක් තුළ මුළුමනින්ම තුරන් කරන අතර, ඒ සියලු අංශ සඳහා පෞද්ගලික අංශයටද බලපාන පරිදි ජාතික ප්‍රතිපත්ති සකස් කෙරේ.
- ඖෂධ පනත වඩාත් ජනතාවාදීව සංශෝධනය කර බලාත්මක කෙරේ.

- නියමිත ප්‍රමිතියෙන් යුත් ඖෂධ පමණක් වෙළඳපොලට නිකුත් කරන අතර ඖෂධ වල අන්තර්ගතය සහ ඒවායෙන් ඇතිවිය හැකි අතුරු ආබාධ පිළිබඳ දැනුවත් කරන පත්‍රිකාවක් (භාෂා තුනෙන්ම) ඖෂධ සමඟ ලබා දෙයි.
- දැනට බහුලව පවතින් වකුගඩු සහ පිළිකා රෝගවලින් පෙලෙන රෝගීන් සඳහා අවශ්‍ය සියළු ඖෂධ සහ අනෙකුත් ප්‍රතිකාර රජය මගින් නොමිලේ ලබා දීමට පියවර ගැණේ.
- දරුවන් නොමැති විවාහක පවුල් සඳහා දරුඵල හිමිකර දීම පිණිස විශේෂ වෛද්‍ය පහසුකම් සහිත ඒකක රජයේ ප්‍රධාන රෝහල් තුළ ඇති කෙරේ.
- පහසු මිලට ගුණාත්මක ඖෂධ ජනතාවට ලබා ගත හැකි පරිදි රාජ්‍ය ඔසුසල් ප්‍රමාණය වසරකට 100 බැගින් වසර පහක් තුළ 500 ක් ස්ථාපිත කෙරේ.
- ඖෂධ හා උපකරණ දේශීයව ඉහළ නැංවීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය පෞද්ගලික ව්‍යවසායික අංශවලට දිරි දෙයි. ඒ වෙනුවෙන් එන නිෂ්පාදන කෙරෙන ආයතන පළමු වසර දෙක තුළ බදුවලින් නිදහස් කෙරේ.
- ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වෛද්‍ය, හෙද, පරිපූරක, අතුරු වෛද්‍ය සහ සෙසු වෘත්තිකයන් 50,000 ක් වසර 5 ක් තුළ රාජ්‍ය සෞඛ්‍ය සේවාවට අනුයුක්ත කෙරේ.
- සෑම ග්‍රාම සේවා වසමක්ම ආවරණය වන සේ ප්‍රජා සෞඛ්‍ය ඒකකයක් පිහිටුවනු ලැබේ. රෝග වැළැක්වීම සහ අවදානම් අඩු රෝග සඳහා ප්‍රතිකාර දීමට අවශ්‍ය වෛද්‍ය, හෙද කාර්ය මණ්ඩලයන් මේ සඳහා අනුයුක්ත කරන අතර එමගින් රජයේ රෝහල්වල තදබදය අවම කෙරේ.
- මෙරට දැනට පවතින 11ක් වන රජයේ හෙද විදුහල් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නා අතර එම ආයතන විශ්ව විද්‍යාල මට්ටම දක්වා උසස් කරනු ලැබේ.
- හදිසි සෞඛ්‍ය අවශ්‍යතා සඳහා විශේෂයෙන්ම වෙන්වූ පැය 24 පුරා ක්‍රියාත්මක දුරකථන අංකයක් හඳුන්වා දෙනු ලබන අතර සෞඛ්‍ය සේවාවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබේ.

- ජනාවාස සේවා ස්ථාන ආදිය පදනම් කරගනිමින් හදිසි ප්‍රතිකාර සහ රෝගී ප්‍රවාහන සේවාවක් දීප ව්‍යාප්ත මට්ටමින් ක්‍රියාත්මක කෙරේ.
- දැනට ගොඩගැසී ඇති අත්‍යවශ්‍ය ශල්‍යකර්ම (හදවත්, වකුගඩු වැනි) හදිස්සියේ සිදු කිරීම සඳහා පෞද්ගලික අංශයේද සහාය ඇතිව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරන අතර, ඒ සඳහා දුම්කොළ බද්ද යොදා ගනිමින් විශේෂ අරමුදලක් ස්ථාපිත කෙරේ.
- පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ දී එක් එක් සිසුවාට අදාළ වෛද්‍ය වාර්තාවක් සැකසීම සහ සෞඛ්‍ය අවදානමක් ඇති සිසුන් නිරන්තර පරීක්ෂාවක් ලක් කිරීම සිදු කෙරේ.
- පුද්ගලයින් 200කට වඩා සේවය කරන සේවා ස්ථානවලදී ජංගම පරීක්ෂණාගාර සහ ජංගම ඖෂධශාලා යෙදා ගනිමින් බෝ නොවෙන රෝග සඳහා මාසික සායන පැවැත්වීමට කටයුතු කෙරේ.
- වැඩකරන ජනතාවට බාහිර රෝගී සහ සායන ප්‍රතිකාර ලබා ගැනීම පහසුවන සේ සතියේ දිනවල උදෑසන 6.00 සිට රාත්‍රී 10.00 දක්වා සහ ඉරිදා දිනයන් ද ආවරණය වන සේ එම සේවාවන් දීර්ඝ කිරීමට පියවර ගනු ලැබේ.
- බටහිර සහ දේශීය සෞඛ්‍ය සේවාවන් පාලනය එක් අමාත්‍යාංශයක් යටතට පත් කෙරේ.
- මේ ආකාරයට සෞඛ්‍ය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ දී අවශ්‍ය පරිදි රජයේ ප්‍රතිකාරද දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% ක් දක්වා වැඩි කිරීමට පියවර ගැනේ.

## සැමට රැකියා දීමට හැකියාවක්

වඩාත් ජවසම්පන්නව මෙරට ශ්‍රම බලකායට දායකත්වය දිය හැකි තරුණ තරුණියන් දස ලක්ෂයකගේ ශ්‍රමය, විරැකියාව හේතුවෙන් අපතේ යමින් තිබේ. ඉහත සඳහන් දස ලක්ෂයට අමතරව තවත් තරුණ තරුණියන් ලක්ෂ 3ක් වාර්ෂිකව ශ්‍රම බලකායට එකතු වේ. **මෙයින් 20,000කට පමණක්, රජයේ විශ්‍රාම යන්නන්ගේ පුරප්පාඩු සඳහා යෙදවිය හැකි අතර ඉතිරි**

**280,000ට පුද්ගලික අංශයේ රැකියා හෝ විදේශ රැකියා සොයාගත යුතුව ඇත.** පහත සඳහන් දිස්ත්‍රික්කවල ශ්‍රම බලකායට අවුරුදු පතා එකතුවන පිරිස ගණන් බලා ඇත.

## කොළඹ දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **2,343,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **1,586,598**
වාර්ෂික උපත් සංඛ්‍යාව **40,797**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **33,997**

## රත්නපුර දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **1,110,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **810,082**
වාර්ෂික උපත් සංඛ්‍යාව **19,153**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **16,106**

## මොනරාගල දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **463,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **339,797**
වාර්ෂික උපත් සංඛ්‍යාව **8,061**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **6,718**

## හම්බන්තොට දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **616,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **462,911**
වාර්ෂික උපත් සංඛ්‍යාව **10,725**
රැකියා අපේක්ෂිත සංඛ්‍යාව **8,938**

## කුරුණෑගල දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **1,636,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **1,266,433**
වාර්ෂික උපත් සංඛ්‍යාව **28,486**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **23,738**

## ගාල්ල දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **1,077,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **819,666**

වාර්ෂික උපත් සංඛ්‍යාව **18,753**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **15,627**

## නුවරඑළිය දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **728,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **534,150**

වාර්ෂික උපත් සංඛ්‍යාව **12,676**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **10,563**

## මාතර දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **826,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **623,812**

වාර්ෂික උපත් සංඛ්‍යාව **14,382**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **11,985**

## බදුල්ල දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **831,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **620,486**

වාර්ෂික උපත් සංඛ්‍යාව **14,469**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **12,058**

## ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **389,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **256,852**

වාර්ෂික උපත් සංඛ්‍යාව **6,773**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **5644**

## අනුරාධපුර දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **879,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **636,733**

වාර්ෂික උපත් සංඛ්‍යාව **15,305**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **12,754**

## මුලතිව් දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **93,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **63,920**

වාර්ෂික උපත් සංඛ්‍යාව **1,619**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **1,349**

## මහනුවර දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **1,397,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **1,049,160**

වාර්ෂික උපත් සංඛ්‍යාව **24,325**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **20,270**

## කෑගල්ල දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **850,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **649,878**

වාර්ෂික උපත් සංඛ්‍යාව **14,000**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **12,333**

## ගම්පහ දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **2,328,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **1,637,537**

වාර්ෂික උපත් සංඛ්‍යාව **40,535**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **33,779**

## මන්නාරම දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **102,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **79,433**

වාර්ෂික උපත් සංඛ්‍යාව **1,776**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **1,480**

## පොළොන්නරුව දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **412,000**

ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **307,125**

වාර්ෂික උපත් සංඛ්‍යාව **7,173**

රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **5,978**

## පුත්තලම දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **778,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **553,009**
වාර්ෂික උපත් සංඛ්‍යාව **13,546**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **11,288**

## අම්පාර දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **666,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **465,757**
වාර්ෂික උපත් සංඛ්‍යාව **11,596**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **9,663**

## වවුනියාව දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **176,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **109,705**
වාර්ෂික උපත් සංඛ්‍යාව **3,064**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **2,553**

## යාපනය දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **593,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **529,239**
වාර්ෂික උපත් සංඛ්‍යාව **10,325**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **8,604**

## කළුතර දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **1,236,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **897,349**
වාර්ෂික උපත් සංඛ්‍යාව **21,521**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **17,934**

## කිලිනොච්චිය දිස්ත්‍රික්කය
ඇස්තමේන්තුගත ජනගහණය **118,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **79,093**
වාර්ෂික උපත් සංඛ්‍යාව **2,054**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **1,712**

## මඩකලපුව දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **534,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **365,167**
වාර්ෂික උපත් සංඛ්‍යාව **9,298**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **7,748**

## මාතලේ දිස්ත්‍රික්කය

ඇස්තමේන්තුගත ජනගහණය **494,000**
ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාව **379,675**
වාර්ෂික උපත් සංඛ්‍යාව **8,601**
රැකියා අපේක්ෂිතයන් බවට පත්වන පිරිස **7,168**

මෙහි සඳහන් කර ඇත්තේ මෙරට දිස්ත්‍රික් අනුව වාර්ෂික රැකියා අපේක්ෂකත්වයයි. ඒ ඒ වශයෙන් මෙකී දිස්ත්‍රික්ක 25ම පදනම් කරගනිමින් අප විසඳුම් සොයා ඇත්තේය.

- දිස්ත්‍රික්ක 25න්ම රැකියා අවස්ථා බිහිවන සේ රැකියා උත්පාදනය කළ යුතුය.
- රැකියා වියුක්තිය අවම කර ගැනීමේ ඉලක්ක සහගත වැඩපිළිවෙලක් මත ගොඩනැගුණු වෘත්තීයමය හැකියා සහිත පුද්ගලයින් විදේශ රැකියා සඳහා යොමු කිරීම රාජ්‍ය මැදිහත්වීමෙන් සිදු කෙරේ.
- අධ්‍යාපනයේ සියලු මට්ටම්වලින් ඉවත්ව යන්නන් සඳහා වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ස්ථාපිත කෙරේ.
- අනියම් පදනමින් හෝ මිනිස් බල සමාගම (Man Power Agency) සේවයේ යොදවා ඇති සියලු සේවකයින්ගේ සේවය ස්ථිර කිරීමට වහාම කටයුතු කෙරේ.
- විදේශ රැකියා ඉලක්ක කරගනිමින් ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත පුහුණු සහ අධ්‍යාපන ආයතන බිහිකළ යුතුවේ. දැනට මෙරට ඇති තාක්ෂණික පුහුණු මධ්‍යස්ථාන අතුරින් රත්මලාන 'ජර්මන් ටෙක්' ආයතනයට සුවිශේෂී වටිනාකමක් හිමිවේ. එවැනි තාක්ෂණික පුහුණු පාසල් දිස්ත්‍රික්කයට එක

බැගින් (24ක්) අනෙක් දිස්ත්‍රික්කවලද වසර තුනක් තුළදී ස්ථාපිත කෙරේ. මෙමගින් වසරකදී අවම වශයෙන් පුහුණු ශ්‍රමිකයන් 40,000 ක් විදෙස් රැකියා සඳහා යොමු කළ හැක.

- සෑම දිස්ත්‍රික්කයකම යොවුන් ශ්‍රම බලකායෙන් 10%කට රැකියාව සඳහා ඉඩ සහිත BPO (Business Processing Centers) කාර්යාල සංකීර්ණ රජයෙන් ඉදිකර, විදේශ රටවල සමාගම්වලට පැය 24 පුරා සේවා සැපයීමට හැකිවන පරිදි පහසුකම් සලසාදෙන අතර එම ව්‍යාපාරය සඳහා ආයෝජනය කරනු ලබන ව්‍යාපාරිකයන්ට විශේෂ සහන පැකේජයක් රජයෙන් පිරිනමනු ඇත. මෙය ඉදිකිරීමේදී ගමනාගමන පහසුව උපරිම වන තැනක ස්ථානගත කිරීම පිණිස විශේෂයෙන් කටයුතු කරනු ලැබේ. මෙමගින් රැකියා 300,000 ක් බිහිකරනු ලැබේ.
- ආයෝජන මණ්ඩලය හරහා රට තුළට කැඳවන ආයෝජකයන්ගේ සංඛ්‍යාව එන්න එන්නම අඩුවෙමින් පවතින අතර වියට්නාමය, තායිලන්තය, මැලේසියාව සහ බංගලිදේශය වෙත යොමුවන ආයෝජකයන්ගේ සංඛ්‍යාව ඉහළ යමින් පවතී. ඒ අනුව අපද එම රටවලින් ආයෝජකයන් විෂයෙහි පිරිනමනු ලබන පහසුකම් සහ බදු සහනවලට සමාන පහසුකම් සපයාදී, ආයෝජකයන් ආකර්ෂණය කරගැනීමේදී එකී රටවල් සමග තරග කළ හැකිවන මට්ටමට ආයෝජන මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර අවුරුද්දකට රැකියා 60,000ක් පමණ අලුතින් බිහි කිරීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කෙරෙයි.
- නිෂ්පාදන ආර්ථිකයක් බලාපොරොත්තුවන අප කර්මාන්තශාලා 300ක් රටතුළ ආරම්භ කිරීමට කටයුතු කරන අතර ඒ හා බැඳුණු ගම්මාන 300ක්ද අප ගොඩනගනු ලැබේ. මෙයින් එක කර්මාන්තශාලාවක් සඳහා අවම වශයෙන් ශ්‍රමිකයන් 500ක් බඳවා ගත්තද නව රැකියා 150,000ක් උත්පාදනය කිරීමට හැකිවනු ඇත.
- විදේශ රටවල රථවාහන පැදවීමට ගැලපෙන සේ රථයේ වම්පසින් සුක්කානම හසුරුවන රියදුරු පුහුණුව ලබාදීම.

## රැකියා සුබසාධනය

- පෞද්ගලික අංශයේ රැකියා සඳහා අවම වැටුපක් තීරණය කරනු ලැබේ.
- ජීවන වියදම පදනම් කරගෙන පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා වාර්ෂික වැටුප් වැඩි කිරීමක් සිදුකිරීම.
- පෞද්ගලික අංශයේ සේවය කරන්නන්ට සහ විදේශ රැකියාවල නිරතවූවන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දීම.
- රාජ්‍ය සේවක සියලුම දීමනා මූලික වැටුපට එකතු කෙරේ.
- දැනට රාජ්‍ය සේවයේ පවතින වැටුප් විෂමතා ඉවත් කරන මෙන් සියලු රාජ්‍ය සේවකයින්ගේ මූලික වැටුප පවතින ජීවන අවශ්‍යතාවයන්ට අනුව ඉවත දැමීමට ජාතික වැටුප් ප්‍රතිපත්තියක් හඳුන්වා දීම අරමුණු කර ගනිමින් ජාතික වැටුප් කොමිෂන් සභාවක් අලුතින් ස්ථාපිත කෙරේ. ඒ සඳහා වෘත්තීය සමිතිවල අදහස් ද ලබා ගැනීමට අදහස් කෙරේ.
- රැකියාවක් ලැබෙන තෙක් රැකියා කළ යුතු වයසේ සෑම කෙනෙක්ටම ජීවත් වීමට ප්‍රමාණවත් දීමනාවක් රජය මගින් ලබා දේ.

## විශේෂ හැකියාවකින් විදේශ රැකියාවකට

- විදේශගත ශ්‍රමිකයන් උපයන ආදායම ලංකාවට එවීමේදී මුහුණ දෙන සියලු බාධා ඉවත් කිරීමට හා එම මුදල් සියලු බදු වලින් නිදහස් කිරීමට පියවර ගැනේ.
- විදේශගත ශ්‍රමිකයන් මුහුණපාන ගැටලු හා දුක් ගැනවිලි විමසා බලා ඊට මැදිහත් වීම සඳහා සෑම තානාපති කාර්යාලයකම ඒ සඳහා වූ අංශයක් පිහිටු වේ.
- විදේශ රැකියා නියුක්තිකයන්ට සිදුවන හිරිහැර, ශ්‍රම සූරාකෑම් ආදී අකටයුතුකම්, සෞඛ්‍ය ගැටලු ආදිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා පැය 24ම ක්‍රියාත්මක විශේෂ ඒකකයක් සහ ගාස්තුවෙන් නිදහස් ඇමතුම් අංකයක් ලබා දීම. අදාල දැනුවත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීමට අමතරව නීති සහා මානුෂික උපදේශන සේවා සැපයේ.
- විදෙස්ගතව රැකියාවල නිරතවන්නන්ට ඔවුන්ගේ වැටුප් කාණ්ඩය සහ ශ්‍රී ලංකාවට එවනු ලබන මුදල් ප්‍රමාණය සලකා තීරුබදු රහිත වාහන මිලදී ගැනීම සඳහා අවස්ථාව සලසා දීම.

- රැකියා සහ අධ්‍යාපනය සඳහා විදේශගත වූ පුරවැසියන්ට විදේශයන් සිට ඡන්දය භාවිතා කිරීම සඳහා පහසුකම් සැපයේ.
- විදේශ රැකියන්වන්හි නිරත වන්නන් හදිසි ආපදාවන්ට හෝ අනතුරුවලට ලක්වූ විට සහ මිය ගිය විට ඔවුන් ලංකාවට ගෙන්වා ගැනීමේදී ඒ සඳහා රජය මැදිහත්වන අතර ඒ සඳහා වන වියදම්ද රජය මගින් භාර ගනු ලැබේ.
- රැකියා සඳහා විදේශගත වූවන්ගේ දරුවන් සහ දෙමාපියන් මුහුණ දෙන අනාරක්ෂිත භාවයට හා වෙනත් සමාජ ගැටලුවලට විසඳුමක් ලෙස ඔවුන් සඳහා විධිමත් සමාජ ආරක්‍ෂණ ක්‍රමයක් සකස් කෙරේ.
- ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාගැනීම සඳහා කැමති ඕනෑම අයෙකුට නොමිලේ අන්තර්ජාලය හරහාත්, රූපවාහිනී වැඩසටහන් මාලා සහ මුද්‍රිත මාධ්‍යය හරහාත් ඉංග්‍රීසි පාඨමාලා පහසුකම් සැපයීම සහ සහතිකපත් පිරිනැමීම. මෙම වැඩසටහන ග්‍රාමීය මට්ටම දක්වා ව්‍යාප්තවූවක් බවට පත්කිරීම.
- විදෙස් රටවල පදිංචි වී රැකියාවේ නිරත ශ්‍රී ලාංකික පවුල්වල සිටින විදෙස් අධ්‍යාපන ක්‍රමවේදයන් තුළ ඉගෙනුම ලැබූ දරුවන්ට, ශ්‍රී ලංකාවේදී අධ්‍යාපනය ලැබීමට සිදුවුවහොත් ඒ සඳහා රජයේ පාසල් සහ විභාග පද්ධතිය තුළ අවශ්‍ය ඉඩකඩ සලසාදීම මෙන්ම එම රටවල අධ්‍යාපනය ලබමින් සිටින අතරතුර වුවද මෙරට රජයේ විභාග සඳහා පෙනීසිටීමට අවසරය ලබාදෙනු ඇත.

## සිහිනයක් නොවන නිවසක්

ලක්‍ෂ 200ක ජනගහනයක් සිටින ශ්‍රී ලංකාවේ නාගරික නිවාස ලක්‍ෂ 5ක්, ග්‍රාමීය නිවාස ලක්‍ෂ 33ක් සහ වතු නිවාස ලක්‍ෂ 2ක් ලෙසින් ඇති සමස්ත නිවාස සංඛ්‍යාව ලක්‍ෂ 40ක් පමණි. මෙරට දිනකට නව විවාහයන් 500ක් සිදුවන අතර ඒ අනුව වර්ෂයකට රටේ පවුල් ඒකක 180,000ක් අලුතින් බිහිවේ. දිනකට මෙරට දික්කසාදවීම් 50ක් වාර්තාවන අතර ඒ අනුව වසරකට පවුල් 18,000ක් නීතියෙන් වෙන්වේ. නිවස යනු උක්ත දෙපාර්ශවයටම පොදුවූත්, මූලිකවූත් අවශ්‍යතාවකි. පොදුවූ අපේක්‍ෂාවකි. විවාහයන් මගින් අලුතින් බිහිවන පවුල් ඒකක 180,000න් 60,000කට පමණ මේ වන විට ඉදිව ඇති නිවාස මගින් සිය නිවාස අවශ්‍යතාව සපුරාගත හැකිය. ඉතිරි පවුල් 120,000ටම තමන්ගේම

නිවාසයක් ඉදිකර ගැනීමේ ප්‍රශ්නය පැන නගී. මෙය දිනෙන් දින උග්‍රවන ගැටලුවකි. මෙතෙක් රට කළ කිසිදු ආණ්ඩුවකට මේ සඳහා ස්ථිර විසඳුම් සැපයීමට හැකිව නැත.

රටේ ජීවත්වන ජනතාවගෙන් බහුතරයකගේ කැමැත්ත වනුයේ නාගරික ප්‍රදේශයක ජීවත්වීමයි. රැකියා සොයා නගරයට පැමිණෙන්නන් විශාල පිරිසක්ද වන නිසා බරපතල ලෙසින් නිවාස අවශ්‍යතාව පැනනගී. මේ අතර විවාහක පවුල් විශාල සංඛ්‍යාවක් බෝඩිං හෝ කුලී නිවාසවල ජීවත්වෙති. නිවාස ප්‍රශ්නය මගින් ඇතිකරන මානසික පීඩනය පවුල තුළ සමගිය බිඳවැටීමටද ප්‍රධාන හේතුවක් බවට පත්ව තිබේ. මේ යථාර්ථය තේරුම්ගෙන, විවාහ පත්වන සෑම යුවලක් වෙනුවෙන්ම නිවසක් පිරිනැමීම රජයේ වගකීමක් බවට පත්කරගනිමින් ඒ හරහා සමාජීය ගැටලු රැසක් විසඳීමට මෙසේ අප කටයුතු යොදමු.

- පවුල් ඒකකයේ ස්වභාවය මත විවිධත්වයෙන් යුත් නිවාස ව්‍යාපෘති සියලු නගරවල ඇරඹීම. ඒ යටතේ
    - ❒ එක් යුවලකට ප්‍රමාණවත්වන නිවසක් (එක් නිදන කාමරයක්, ආලින්දය, නානකාරය සහ මුළුතැන්ගෙයකින් සමන්විත)
    - ❒ දරුවෙකු සමග එක් පවුලකට ප්‍රමාණවත් නිවසක් (නිදන කාමර 2, සාලය, නානකාමරය හා මුළුතැන්ගෙයකින් සමන්විත)
    - ❒ දරුවන් තිදෙනෙකු සමග ජීවත්වන පවුලක් සඳහා ප්‍රමාණවත් වන නිවසක් (නිදන කාමර 3ක්, ආලින්දයක්, නානකාමර 1ක් සහ මුළුතැන්ගෙයකින් සමන්විත)
- මෙයට සමගාමීව නාගරික/ අර්ධ නාගරික/ ග්‍රාමීය ප්‍රදේශවල නිවාස ව්‍යාපෘති ඇරඹීමේදී ඒ සියල්ලට අදාළ යටිතල පහසුකම් ගොඩනැගීම සහ ඒවා සංවර්ධනය කිරීම
- පවතින සෑම මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහාම මාතෘ සහ ළමා සායනවලට අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීම. එමෙන්ම ළදරු පාසල්, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ තැපැල් කාර්යාල ආදිය ඉදිකිරීම.

- අලුතින් ඉදිවන සෑම මහල් නිවාස ව්‍යපෘතියක් සමගම විවාහ සහ අවමගුල් කටයුතු සඳහා ශාලා පහසුකම් ස්ථාපිත කිරීම. ඒ සමග ළමා ක්‍රීඩාංගණයක් සැකසීම, උද්‍යාන, කඩසාප්පු, වෛද්‍ය මධ්‍යස්ථාන, ආපනශාලා ආදී වූ පොදු පහසුකම් සැපයෙන ‘සේවා පියසක්’ ගොඩනැගීම.
- නිවාස ඉදිකිරීම සඳහා ණය සැපයීමේදී, පරම්පරාවකින් පරම්පරාවට එය දරාගත හැකිවන සේ ණය ආධාර ක්‍රමයක් හඳුන්වාදීම (Inter-generation housing loans)
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මැදිහත් වීමෙන් මූලික පහසුකම් සියල්ල ඇතුළත් මහල් නිවාස ඉදි කෙරේ.
- රාජ්‍ය හා පුද්ගලික සමාගම් මගින් සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගත් නව නිවාස සංකීර්ණ ඉදි කිරීම මගින් වාර්ෂිකව නිවාස ඒකක 20,000 ක් ඉදි කරනු ලබන අතර එම නිවාස ලබා ගැනීමට ජනතාවට මූල්‍ය සේවා ලබා දේ.
- අවදානම් ප්‍රදේශවල ජීවත්වන්නන් මුඩුක්කු සහ පැල්පත්වාසී සියලු දෙනාට රජය මගින් පහසුකම් සහිත නිවාස සංකීර්ණවලින් නිවාස ලබා දෙන අතර දැනට ලයින් කාමරවල ජීවත්වන වතු කම්කරුවන්ට පහසුකම් සහිත නිවාස ලබා දීම සඳහා කඩිනම් පියවර ගැනේ.
- ප්‍රමිතියට නැති නිවාස ප්‍රමිති මට්ටමට ගෙන ඒම සඳහා වාර්ෂිකව නිවාස හිමියන් 25,000කට රුපියල් ලක්ෂයක්, ලක්ෂ පහක් අතර ණය මුදලක් 1% පොළියට ලබා දෙයි.
- අඩු වියදම් නිවාස ඉදි කිරීමට අදාළ පර්යේෂණ හා ව්‍යාප්ති සේවා දිරිමත් කෙරේ.
- නිවාස කුලියට දීමට සහ කුලියට ගැනීමට අදාළව ප්‍රමිතියක් නොමැති හේතුවෙන් සිදුවන අක්‍රමිකතාවයන් සහ අපහසුතාවයන් මග හැරවීම සඳහා කුලී නිවාස සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයන් නීති සහ ව්‍යවස්ථාපිත නව ආයතන ව්‍යුහයක් ස්ථාපිත කෙරේ.

## ජනතාවාදී ආණ්ඩුවක්, ප්‍රියමනාප රාජ්‍ය සේවයක්

ආණ්ඩුවක කාර්යභාරය වනුයේ ජනතාවට සතුට ළඟාකරදීමය. ජනතාවට සේවය කරමින් එකම අරමුණක් එල්ලයේ වැඩකිරීමය. අනාගතයේ බිහිවන ආණ්ඩු ගැන කථා කිරීමේදී ජනතා විමුක්ති පෙරමුණ විසින් විශේෂ කොට දක්වනු ලබන්නේ අපි ජනතාවගේ පහසුව තකා සේවාවන් සපයන්නේ කෙසේද යන්නයි. සැබෑ නායකයා යනු ඔහුගේ කණ්ඩායමට ශක්තිය සහ හැකියාව කැඳවිය හැකි සතුටුදායක තත්ත්වයන් නිර්මාණය කළ හැකි පුද්ගලයාය. ශ්‍රේෂ්ඨ නායකයකු විසින් තවත් ශ්‍රේෂ්ඨ නායකයන් රැසක් බිහි කරනු අතර සිය ජනතාවගේ යහපත සලකා නායකත්වය සේවාවක් ලෙස දකින අයෙකි. රාජ්‍ය පාලනය හා සේවය යනු අතිශයින් ගාම්භීර වගකීමකි. රටවැසියා උදෙසා සොඳුරු සත්කාරයක් කළ හැකි මගකි. රටෙහි දිශානතිය පිළිබඳ තීරණාත්මක සාධකයකි.

ජනතාවාදී ආණ්ඩුවක් සහ ප්‍රියමනාප රාජ්‍ය සේවයක් වෙනුවෙන් නිවැරදි දේශපාලන පක්ෂයක් ජයග්‍රහණය කිරීමේ වගකීම පවතින්නේ ජනතාව වෙතය. එම වගකීම ඔබ ඉතාම නිවැරදිව ඉටු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

- රාජ්‍ය සේවක සියලුම දීමනා මූලික වැටුපට එකතු කිරීම.
- බාහිර බලපෑම්වලින් තොරව ස්වාධීනව තම සේවය ඉටුකිරීමට හැකිවන පරිදි රාජ්‍ය සේවය සුරක්ෂිත කිරීමේ නීති පද්ධතියක් ස්ථාපිත කිරීම.
- පෞද්ගලික අංශයේ කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම සමග සමව තරගවැදිය හැකි රාජ්‍ය සේවයක් බිහිකිරීම උදෙසා රාජ්‍ය සේවකයාගේ ආකල්ප වර්ධනය පිණිස, පෞද්ගලික අංශය හරහා රාජ්‍ය සේවකයාට පුහුණු සහ අධීක්ෂණ වැඩසටහන් මාලාවක් හඳුන්වාදීම.
- රාජ්‍ය අංශයේ සේවය බලාපොරොත්තුවෙන් පැමිණෙන්නා හට වඩාත් ආචාරශීලී සේවයක් ලබාදීම වෙනුවෙන් මහජන සම්බන්ධතා පැවැත්වීම පිළිබඳ රාජ්‍ය සේවකයා පුහුණු කිරීම සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම.

- රාජ්‍ය අංශයේ රැකියා උත්පාදනයේදී, රාජ්‍ය අංශය යනු රැකියා සපයන මාධ්‍යයක් නොව රටේ පැවැත්ම සහ රට ඉදිරියට ගෙනයෑම උදෙසා සේවා සපයන මාධ්‍යයක් විය යුතුය යන ප්‍රතිපත්තියේ පිහිටා කටයුතු කිරීම.
- පෞද්ගලික අංශයේදී අදාළ සේවකයා හට සේවා ඉලක්ක පිරිනැමෙන අතර රාජ්‍ය අංශයේදී බොහෝ විට එවැන්නක් සිදු නොවේ. එබැවින්, වඩාත් ඵලදායී සේවාවක් උදෙසා රාජ්‍ය අංශයේ සේවකයාටද සේවා ඉලක්කයන් ලබාදීම. එම ඉලක්කයන් සපුරාලීමේදී ඔවුන්ව විශේෂ ඇගයීමට ලක්වන ක්‍රමවේදයක්ද සැකසීම.
- පෞද්ගලික අංශයට සාපේක්ෂව රාජ්‍ය අංශය විසින් නවීන තාක්ෂණය යොදාගැනීම අවම මට්ටමක පවතී. මේ පිළිබඳ විශේෂයෙන් සැලකිල්ලට ගෙන රාජ්‍ය අංශය සඳහා වඩා පුළුල් ලෙස පරිගණක තාක්ෂණය, අන්තර්ජාලය ආදිය යොදාගනිමින් වඩාත් ශක්තිමත් සහ සක්‍රීය රාජ්‍ය සේවාවක් ගොඩනැගීම.
- රාජ්‍ය ආයතනයකින් සේවය ලබාගැනීම පිණිස යම් පුද්ගලයකු පැමිණීමේදී ඔහුට අවශ්‍ය සේවාව සපයන සේවකයා යම් ලෙසකින් නිවාඩු ගොස් ඇත්නම්, එකී සේවාව බලාපොරොත්තුවෙන් පැමිණි පුද්ගලයාට නැවත වරක් ඒ වෙනුවෙන් පැමිණීමට අවශ්‍ය නොවන පරිදි මෙන්ම ඔහුගේ කාලය අපතේ නොයන සේ තවත් සේවකයකු විසින් අදාළ සේවය ආවරණය වීමට සැලැස්වීම.

## 'වංචා, දූෂණ, මත්කුඩු, අපරාධ' නැත - නීතිය සැමට සාධාරණ වනු ඇත.

අද රට කරවීමට සමාන්තර අනියම් යාන්ත්‍රණය බවට පත්ව ඇත්තේ වංචාවයි. දූෂණයෙන් තොර  පැවැත්මක් නැත යන තැනට රට කරවන්නන්ගේ ආකල්ප පිරිහී තිබේ. මත්කුඩු යනු රටේ එක්තරා බලවන්තයන් පිරිසකගේ අනියම් ආර්ථිකයකි. මේ සියල්ල විසින් රට අපරාධ සංස්කෘතියක් වෙත ඇද දමා ඇත. නීතිය වචනයේ අර්ථයෙන්ම නීතියක් වූයේ නම් අද වංචාව, දූෂණය, මත්කුඩු සහ අපරාධ යන වචන සමාජයට නුහුරු නුපුරුදු වචන විය යුතුය.

මේ සැලැස්ම වංචාව, දූෂණය, මත්කුඩු සහ අපරාධ වැනි වචන සමාජයෙන් ධූරීභූත කරවීමටත්, ඒ සඳහා උසාවිය උපරිමයෙන් උපකාරවන තැනකට රැගෙන ඒමටත්ය.

### අපරාධ සහ මත්කුඩු පාලනය

- වාර්තා පරීක්ෂාකර තහවුරුකරගත් වෘත්තීයමය මත්ජාවාරම්කරුවන් සඳහා දැඩි දඬුවම් පැනවීම. මෙහිදී එලෙස දඬුවමට ලක්වූවෙකු සඳහා කිසිදු අයුරකින් දඬුවම් කාලය හෝ දඬුවම ලිහිල් නොවන ලෙසින් නීති දැඩි කිරීම.
- මත්කුඩු සඳහා යොමුවීම අපරාධයක් ලෙසින් නොව දුබලතාවයක්ය යන ආකල්පයේ සිට පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් ඇතිකිරීම. එම පුනරුත්ථාපන ආයතන නවීන පහසුකම් ඇතුළත්ව ස්ථාපිත කෙරේ.
- දෙමාපිය රැකවරණය නොමැති දරුවන් රැකබලා ගැනීම සඳහා වගකිව යුතු කිසිවෙකු නොමැති වැඩිහිටියන්, මත්පැන්වලට යොමුවූවන්, බාල අපරාධකරුවන් ආදීන් රැක බලා ගැනීමට හා පුනරුත්ථාපනය කිරීමට කටයුතු කෙරේ.

### වඩාත් කාර්යක්ෂම උසාවි පද්ධතියක්

වසරක් ආරම්භවෙද්දී මෙරට උසාවි පද්ධතියේ ලක්ෂ 9කට ආසන්න නඩු ගොඩගැසී තිබේ. මේ අතරින් 25,000ක් පමණ ඉඩම් සම්බන්ධ බෙදුම් නඩුය. වසරකදී තීන්දු දී අවසන් වනුයේ මෙවැනි නඩු අතරින් 2,400ක් තරම් සුළු සංඛ්‍යාවකි. මේ අනුව සාමාන්‍යයෙන් ඉඩම් බෙදා වෙනස් කිරීමේ නඩුවක් විසඳුමට ලක්වන කාලය අවුරුදු 10ක් පමණ වේ.

ඉඩම් ආරවුල් සම්බන්ධවද නඩු 25,000ක් පමණ ගොඩගැසී තිබේ. මෙරට උසාවි පද්ධතියේ වසරක කාල පරාසයක් තුළ විසඳුම් ලැබෙන එවැනි නඩු සංඛ්‍යාව 4,100කි. ඒ අනුව ඉඩම් ආරවුල් නඩුවක විසඳුම පිණිස ගතවන කාලය සාමාන්‍යයෙන් වසර 6කි.

මුදල් සහ ව්‍යාපාරික ගැටලු සම්බන්ධයෙන් උසාවිය හමුවේ ගොඩගැසී ඇති නඩු සංඛ්‍යාව 48,000ක් පමණ වුවද වසරක කාල පරාසයේදී උසාවි මගින්

තීන්දු දී අවසන් කෙරෙනුයේ එවැනි නඩු 14,000කි. එනම් එවැනි නඩුවක් විසඳීම පිණිස මෙරට උසාවියට ගතවන කාලය සාමාන්‍යයෙන් වසර 4කි. නමුත් අනෙකුත් රටවල නඩුවක විසඳුම පිණිස ගතවන කාලය වසරක් පමණි.

සුරාබදු සහ අන්තරාකාර මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වසරකදී නඩු 235,000ක් පැනවෙන අතර රථ වාහන සම්බන්ධයෙන් නඩු 290,000ක් වසරක කාලයේදී අලුතෙන් ගොනුවේ.

- යල්පැන ගිය පැරණි නීති වෙනුවට නූතන තත්වයට ගැලපෙන පරිදි නීති පද්ධතිය සකස් කෙරේ. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කෙරේ. නීති ආධාර දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කර එම ප්‍රතිලාභ මහජනතාවට ඉතා පහසුවෙන් ලබා ගත හැකි ආකාරයට විමධ්‍යගත කෙරේ. තාක්ෂණික පහසුකම් මෙන්ම මානව සම්පත් තුළින් එම සේවාව පුළුල් කෙරේ.
- දැනට ගොඩ ගැසී ඇති අති විශාල නඩු සංඛ්‍යාව ඉක්මනින් විසඳීමේ පිළියමක් ලෙස විනිශ්චයකාරවරුන්ගේ ප්‍රමාණය වැඩි කර නඩු විභාග කරන කාල සීමාව දීර්ඝ කෙරේ. එමගින් අධිකරණවල වසරක දී නිමා කරන 875,000 වූ නඩු සංඛ්‍යාව ලක්ෂ 12 දක්වා වැඩි කෙරෙයි.
- වසරකදී ගොනුවන 290,000 රථවාහන නඩු සංඛ්‍යාව ලක්ෂය දක්වා අඩු කිරීමේ පියවරක් ලෙස රථ වාහන වැරදි සම්බන්ධයෙන් පොලිසිය මගින් නිකුත් කරන ලද දඩ මගින් මෙම රථ වාහන නඩු විසඳීමට කටයුතු කෙරේ.

## දරුවා හා කාන්තාව සුරැකෙන සමාජයක්

දරුවා යනු හෙට රටයි. කාන්තාව යනු යහපත් සමාජ පැවැත්මක තීරණාත්මක සාධකයයි. එවන් පැවැත්මක් පිළිබඳ කැඩපතයි. දරුවාට ළමා ලොව රැකදිය හැකිනම්, කාන්තාවට සමාජ සුරක්ෂිත බව පිදිය හැකිනම්, රටේ හෙට ගැනද, යහපත් සමාජ පැවැත්මක් ගැනද වද විඳයුතු නැත. මේ ඒ සඳහා මාර්ගයයි.

- ළමා සහ කාන්තා හිංසනයන් පිළිබඳ තොරතුරු දැන්වීම සඳහා දැනට පවතින උපකාරක ඇමතුම් සේවය (හෙල්ප්ලයින්) වඩාත් ඉක්මන් ප්‍රතිචාර දැක්වීමක් සිදුවන ආකාරයට සක්‍රිය කිරීම සහ ලිංගික අතවරයන්ට ලක්වන්නන්ගේ පෞද්ගලිකත්වය අතිශයින් සුරැකෙන පරිදි උපදේශනයන් ලබාදීම, නීතිමාර්ගයන්ට පිවිසීම සඳහා අවශ්‍ය උපදෙස් සහ පහසුකම් සලසාදීම පිණිස, දූෂණ හෝ අතවරයන් පිළිබඳ ආපදා මධ්‍යස්ථානයක් පිහිටුවීම.
- හිංසාකාරී ඇමතුම් හරහා සිදුකරන පීඩනය සහ වාචික අතවරයන් පිළිබඳ නීතිරීති සකස්කිරීම සහ වරදකරුන්ට නිසි දඬුවම් පැනවීම.
- පාසල් අධ්‍යාපනය ලැබීමේ අනිවාර්යය වයස් සීමාව අවුරුදු 16 දක්වා වැඩි කරන අතර අවුරුදු 16ට අඩු දරුවන් රැකියාවල නිරත කිරීම සපුරා තහනම් කෙරේ.
- ළමා හිංසනය හා අපයෝජන වැළැක්වීමට අවශ්‍ය පරිපාලන හා සමාජයීය ප්‍රතිසංස්කරණ සිදු කරන අතර ඒවා උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීති මඟින් කටයුතු කෙරේ.
- දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ දීප ව්‍යාප්ත සමීක්ෂණයක් සිදු කර දිවයින පුරා ඒවා විධිමත්ම පිහිටුවීමේ වැඩපිළිවෙලක් ආරම්භ කෙරේ. රැකියාවන්වන්හි නිරත මවුවරුන්ගේ දරුවන් වෙනුවෙන් නිවාස හෝ රැකියාව කරන ස්ථානය ආසන්නයේ එවැනි මධ්‍යස්ථාන ස්ථාපිත කෙරේ.
- නිල් චිත්‍රපට හා අසභ්‍ය වෙබ් අඩවිවලට දරුවන් ගොදුරු වීම වැළැක්වීම සහ ඉන් සිදුවන මානසික සහ ශාරීරික ගැටලු පිළිබදව දෙමාපියන් පාසල් මට්ටමින් දැනුවත් කරන අතර නිවෙස්වලදී එවැනි දර්ශන සහ අසභ්‍ය වෙබ් අඩවි බැලීමට ඇති ඉඩ ඇහිරීමට දෙමාපියන්ගේ සහාය ලබා ගැනීමත් ඒ සඳහා නවීන තාක්‍ෂණ විධික්‍රම හඳුන්වා දීමත් සිදු කෙරේ.
- විවාහ ජීවිත තුළදී කාන්තාවන් මුහුණ දෙන ගැටලු සහ අසමානතාවය අහෝසි කිරීම සඳහා දෑවැදි ක්‍රමය තහනම් කරන අතර දරුවන් ලැබීමේ තීරණ ගැනීමේ අයිතිය කාන්තාවන් සතු කෙරේ.

- සාර්ථක විවාහ ජීවිතයන් සහතික කිරීමටත්, දික්කසාද, කාන්තා හිංසන, ළමා හිංසන, මානසික පීඩනය, අන්තර් පුද්ගල ගැටුම්, සිය දිවි නසා ගැනීම් අවම කිරීමත් උදෙසා, විවාහ අපේක්ෂක සියලු තරුණ තරුණියන්ට ඉඩම් මිලදී ගැනීම, නිවාස ඉදි කිරීම, මුදල් කළමනාකරණය, කායික, මානසික, සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම, ලිංගික අධ්‍යාපනය හා ප්‍රජනන සෞඛ්‍ය ගැටුම් වැළැක්වීම, දරුවන් රැකබලා ගැනීම ආදියට අදාළ සියලු කරුණු ඇතුළත් දින දෙකක පාඨමාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක වන පරිදි ආරම්භ කෙරේ.

## කෘෂිකර්මාන්තයට පෝෂණයක් - ධීවර කර්මාන්තයට ප්‍රබෝධයක්

ශ්‍රී ලංකාව යනු වගාව විෂයෙහි සොබාදහමින් ඉහළින්ම ආශිර්වාදය ලත් රටකි. කිසිවක් වැවිය නොහැකි කාන්තාර හෝ හිම මිදුණු දේශගුණ මෙහි නැත. ඒ ඒ වගාවන් සඳහා සුදුසු සියලු දේශගුණික කලාප මේ සරුසාර ලක් පොළොව මත තිබේ. වසර 2000කට අධික වාරි ශිෂ්ඨාචාරයක්, වගා දැනුමක් සමග ජල මූලාශ්‍රවලින්ද අනූන මේ රට කෘෂිකාර්මාන්තයෙන් ස්වයංපෝෂිත කර, වචනයේ අර්ථයෙන්ම පෙරදිග ධාන්‍යාගාරය බවට පත්කිරීමට නොහැකි මන්ද යන්න විශ්මය දනවන ගැටලුවකි. මේ එයට විසඳුම්ය.

රට වටකර ගත් මුහුදින්, රට අභ්‍යන්තරයේ පිහිටි ජලාශ රැසකින් ජීවිකාව සරිකරගන්නා කරදිය සහ මිරිදිය ධීවර කාර්මිකයන් 266,000ක් සහ ඔවුන්ගෙන් යැපෙන්නන් මිලියනකට අධික පිරිසක් සිටියද ඉකුත් සෑම රජයක්ම මෙහි සැබෑ පරිමාණය දුටුවේ නැත. එබැවින් සැමදා ධීවරයා යනු සුළුවෙන් සැලකුම් ලැබූ, වැඩියෙන් ගැහැට විඳි ප්‍රජාවක් විය. පොළොවෙන් අස්වැන්න නෙළාගන්නා ගොවියා මෙන්ම දියෙන් අස්වැන්න ගෙනෙන ධීවරයාද අපගේ මේ වැඩපිළිවෙළ යටතේ ජීවිතය ජයගනු නියතය.

- කෘෂිකර්මාන්තය ආර්ථිකයේ ප්‍රමුඛ ක්ෂේත්‍රයක් ලෙස සලකා රට තුළ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සහ අපනයන වෙළඳපොළ ඉලක්ක කර ගත් කාර්මීකරණයක් කෘෂිකර්මාන්තය තුළ ඇති කෙරේ.

- බීජවල අයිතිය ගොවි ජනතාව සතුවන පරිදි බීජ පර්යේෂණ ආයතන හා බීජ ගොවිපොලවල් නගා සිටුවීම සහ බීජ නිෂ්පාදන ගොවි ජනතා ජාලයක් ගොඩනැගේ. නව වැඩිදියුණු කළ බීජ ප්‍රභේද සහ දේශීයව දෙමුහුන් ප්‍රභේද (F1) නිෂ්පාදනය කර ගොවීන්ට ලබා දීමටත් දෙමුහුන් බීජ සැකසීමේ තාක්ෂණයන් ගොවීන්ට හඳුන්වා දීමටත් පියවර ගැනේ.
- කාබනික පොහොර සහ මිනිසාට හිතකර ජෛව තාක්ෂණයේ යොදා ගැනීම් ප්‍රවර්ධනය කෙරේ.
- කෘෂි නිෂ්පාදනවල මිල උච්ඡාවචනය පාලනය කිරීම අරමුණුකරගත් ජාතික වගා සැලැස්මක් සකස් කොට ක්‍රියාත්මක කරනු ලැබේ.
- වී මිලදී ගැනීම සඳහා රාජ්‍ය දායකත්වය ඉහළ දමන අතර මිල තීරණය කිරීමේ සූත්‍රයක් හඳුන්වා දෙයි. වාර්ෂිකව ස්ථාවර මිල ප්‍රකාශ කිරීම සහ මිල සඳහා නීතිමය ආවරණයක් ස්ථාපිත කෙරේ.
- කෘෂිකාර්මික ඉඩම් චිරස්ථායී භාවිතයට අවශ්‍ය මූලික උපායමාර්ග සැකසීම සිදු කරන අතර ඉඩම් අයිතිය අඳ, ගොවි අයිතිය, කෘෂි ඉඩම් ගොඩකිරීම සහ නව ඉඩම් ලබා දීම වැනි වැදගත් මූලික අංග සඳහා ප්‍රජා සහභාගීත්වය තහවුරු කිරීම.
- කෘෂි තාක්ෂණය හා දියුණු කළමනාකරණය ගොවි ජනතාව වෙත ගෙන යෑම සඳහාත් ඵලදායිතාවය වැඩි කිරීම සඳහාත් ඉවහල්වන ආදර්ශ ගොවිපොළ පද්ධතියක් ඇති කෙරේ.
- බිම් සැකසීම සහ අනිකුත් යන්ත්‍ර සූත්‍ර සුලබ කිරීම සඳහා රජය මැදිහත් වීමෙන් පළාත් පාලන ආයතන මගින් ගොවීන්ට සහන කුලී පදනමක් මත යන්ත්‍ර උපකරණ ලබා දෙයි.
- කෘෂි සමූපකාර ක්‍රමය හඳුන්වා දීම. කෘෂි නිෂ්පාදන සමිති හඳුන්වා දෙයි. ගොවි පවුල් 400 ක් නිෂ්පාදන ගම්මානයක් / ඒකකයක් ලෙස සලකා නව තාක්ෂණයන් ආදර්ශනයක් මගින් ගොවීන් වෙත ගෙන යෑමේ ක්‍රියාවලියක් ඇති කෙරේ.
- රජයේ කෘෂිකාර්මික නිෂ්පාදනය පදනම් කරගෙන කෘෂිකාර්මික පුහුණුව සහ කෘෂි අධ්‍යාපනය මෙහෙය වේ.

- පවතින දේශගුණික විපර්යාස ආවරණය වන පරිදි රාජ්‍ය මැදිහත්වීම සහිතව ගොවි සහභාගිත්වයෙන් ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබා දෙන කෘෂි රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කෙරේ.
- කෘෂිකර්මාන්තය මත පදනම් වූ ද්වීතීයික හා තෘතීයික කෘෂිකර්ම පශු සම්පත් සහ ධීවර ක්ෂේත්‍රයේ නිරත පුද්ගලයින් දැනට පෙළෙන ණය බරින් නිදහස් කිරීමට රජය මැදිහත් වන අතර කර්මාන්තය සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සහ මුදල් කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනයන් ද ඇතුළත් නව සහනදායී ණය ක්‍රමයක් ඇති කෙරේ.
- අධි අස්වනු බීජ නිෂ්පාදනය සඳහා දේශීය පර්යේෂණාගාර යොමු කිරීම හා විදේශ වෙළෙඳ අධිකාරිය බිඳ දැමීමට හැකි වන සේ දේශීය බීජ නිෂ්පාදනය දියුණු කෙරේ.
- යූරියා ඇතුලු අත්‍යවශ්‍ය පොහොර නිපදවීම සඳහා රාජ්‍ය පොහොර නිෂ්පාදනාගාරයක් ඇති කෙරේ.
- කාබනික හා අකාබනික පොහොර යෙදීම ක්‍රමානුකූල කිරීම හා කාබනික පොහොර නිෂ්පාදනය කර්මාන්තයක් ලෙස ප්‍රචලිත කිරීමට ක්‍රියා කෙරේ.
- පසු අස්වනු හානිය අවම කිරීමට අවශ්‍ය ඇසුරුම්, ප්‍රවාහන මාධ්‍යය, ශීතාගාර, ගබඩා වැනි නවීන තාක්ෂණයන් හඳුන්වා දීමත් ඒ සඳහා ජන සහභාගීත්වය යොදා ගැනීමත් සිදු කෙරේ.
- අත්‍යවශ්‍ය පොහොර වර්ග සියලුම ගොවීන්ට සහනදායී මිලකට ලබා දේ.
- විසිතුරු මල් හා පැළ විශේෂයෙන් අපනයන වෙළෙඳ පෙළ ඉලක්ක කර ගනිමින් වැඩි දියුණු කරන අතර මල් හා පැළ වර්ග ඉලක්ක කර ගත් රාජ්‍ය ගොවි පොළ පිහිටු වෙයි.
- ජංගම පාංශු පර්යේෂණ විද්‍යාගාර බිහිකිරීම සහ එමගින් ප්‍රදේශයේ පසේ ස්වභාවයට උචිත වගාව සහ පසට අවශ්‍ය සියළුම යෙදවුම් තීරණය කිරීම.
- ඉඩමේ ප්‍රමාණය අනුව සෑම නිවසකම ඉහළ වටිනාකමකින් යුත් දැව ලබාදෙන ගස් වර්ග, අවම වශයෙන් එකක්වත් මහජනයාගේ ඉඩම්වල වැවීමට කටයුතු කිරීම.

- ඉහළ වටිනාකමකින් යුත්, අපනයන තත්ත්වයේ වන, රික්තක තාක්‍ෂණය ඔස්සේ ඇසුරුම්කළ ආහාර සැකසීමේ ක්‍රමවේදය සඳහා පහසුකම් සැලසීම.

## ධීවර කර්මාන්තය

- දැනට ඇති නැංගුරම් පොළවල් 58 අමතරව නව නැංගුරම් පොළවල් පිහිටුවනු අතර පළමු වසර තුළ ඉන් 25 ක් ස්ථාපිත කෙරේ. දැනට 880ක් පමණ වන තොටුපලවල් ප්‍රමාණය සංවර්ධනය කෙරේ.
- දැනට තිබෙන මිරිදිය මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවන හෙයින් ඒවායේ පහසුකම් වැඩි කිරීමත් අභ්‍යන්තර ජල ජීවී වගාවට ප්‍රමාණවත් ලෙස අභිජනන මධ්‍යස්ථාන ඇති කිරීමටත් ලංකාවට වඩාත් උචිත නව මත්ස්‍ය විශේෂ හඳුන්වාදීමත් සිදු කෙරේ.
- මත්ස්‍ය සහ ජලජ පැළෑටි ආශ්‍රිත ආහාර නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලා ආරම්භ කෙරේ.
- මුහුදේදී සිදුවන ස්වභාවික විපත් කල් ඇතුව දැනුවත් කිරීම සඳහා වරාය, නැංගුරම් තොටුපළ හා තොටුපළ මට්ටමේ ක්‍රමවත් වැඩපිළිවෙළක් සකස් කිරීමටත් ධීවර යාත්‍රාවලට දියුණු තාක්ෂණික මෙවලම් ලබා දීමටත් කටයුතු කෙරේ.
- ඉන්දියාව ඇතුළු විදෙස් රටවල ධීවර යාත්‍රා මගින් සිදුවන ධීවර ආක්‍රමණය සම්පූර්ණයෙන් නැවැත්වීමට කටයුතු කෙරෙන අතර මෙරට ධීවරයන්ට අවශ්‍ය ආරක්ෂාව සැලැස්වීමට කටයුතු කෙරේ.
- ධීවර ජනතාව මුහුණ පා සිටින බරපතළ ගැටලු වන නිවාස, පානීය ජලය සෞඛ්‍ය වැනි ගැටලු වහාම විසඳීම සඳහා ඊට අදාළ අංශ සමග එක්ව කඩිනම් ක්‍රියාමාර්ග ගැනේ.
- සියලු ධීවර වෘත්තිකයන් සඳහා රජයේ පොදු විශ්‍රාම වැඩ පිළිවෙළ යටතේ විශ්‍රාම වැටුප් ලබා දෙයි.
- මහ මුහුදේදී සිදුවන ධීවරයකුගේ ජීවිත හානියක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10 ක රක්ෂණාවරණයක් පිරිනැමීම.

- දැනට ලෝකයේ අනිකුත් රටවල කුඩා ධීවර බෝට්ටු සඳහා මාළු සෙවීමේ උපකරණ (FISH FINDER) සවිකර ඇත. කුමන ස්ථානයේ, කොපමණ ගැඹුරක, කුමන ප්‍රමාණයේ මාළු සිටිත්ද යන්න ගැන තොරතුරු සැපයෙන එම තාක්ෂණික ධීවර උපකරණ සියලු කුඩා ධීවර බෝට්ටුවලට ලබා දෙනු ඇත.

## සත්ව පාලනයට ඉහළ තත්ත්වයක්

- ග්‍රාමීය ප්‍රදේශවල ආදායම් වැඩි කිරීම සඳහා මී මැසි පාලනය සහ කුකුල් ගොවිපොළ ඇතිකිරීම ඇතුළු පහසුවෙන් ඇති කළ හැකි සත්ව පාලන ක්‍රම වැඩි දියුණු කිරීම.
- කිරි, බිත්තර හා මස් වෙළෙඳපොල මිලෙන් වැඩිම ප්‍රතිශතයක හිමිකම නිෂ්පාදකයින්ට ලබා ගත හැකිවන පරිදි මෙන්ම තම කර්මාන්ත හා නිෂ්පාදන පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන්ට ද බලපා ඇති සත්ව නිෂ්පාදකයන් ඇතුළත් ගොවිජන අධිකාරියක් පිහිටුවේ.
- තෘණ වගා කළ හැකි සෑම භූමියකම ඒ ඒ දේශගුණික හා පාංශු තත්වයන්ට ඔරොත්තු දෙන සහ වැඩි අස්වනු ලබා දෙන දියුණු තෘණ වර්ග සහ ශාක වර්ග වගා කිරීම සහ ප්‍රචලිත කිරීමට රජය මැදිහත් වීම.
- කිරි ගම්මාන 1000 ක් නගා සිටුවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර යෝගට්, චීස්, මුදවපු කිරි ඇතුළු වෙනත් කිරි ආශ්‍රිත නිෂ්පාදන දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි ප්‍රචලිත කිරීමට රජය මැදිහත් වෙයි.
- කිරි නිෂ්පාදනය වේගවත්ව වර්ධනය කිරීමේ අරමුණින් මධ්‍ය පරිමාන ව්‍යවසායකයන් එම ක්ෂේත්‍ර තුළ ආයෝජනය කිරීම දිරිමත් කිරීමට පියවර ගැනේ.
- රටට අවශ්‍ය සියලුම නැවුම් කිරි සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන මුළුමනින්ම රට තුළ නිෂ්පාදනයට අවශ්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කෙරේ.

# පරිසරයට රක්ෂණයක්

අද මෙරට වනගහණය සමස්ත භූමි ප්‍රමාණයෙන් 28.5%කි. ජනගහන වර්ධනයට අනුව අවශ්‍යතා සැපයීම වෙනුවෙන්, බිම නිසි පරිදි කළමනාකරණය කිරීමක් නොවන බැවින් සෑම වසරකම 0.5%ක් බැගින් මේ රටේ වනගහණය ක්ෂය වෙමින් පවතී. මෙය මේ අයුරින් ඉදිරියට සිදුවුවහොත් තවත් වසර 57කදී මෙරට වනපෙත සහමුලින්ම අහිමිව යන තත්ත්වයක් මතුව ඇත. අපගේ මේ ඉලක්කය ජනතාව මෙන්ම පරිසරයටද සීමා නොපැනවෙන පරිසර කළමනාකරණයකටය.

- පරිසරය සුරැකීම සඳහා ප්‍රජා සහභාගීත්වය ඉලක්ක කර ගත් මාධ්‍ය භාවිතයක් ඇති කරන අතර පරිසරය රැකීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අධ්‍යාපනික වැඩසටහන් සකස් කෙරේ. පරිසර ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සඳහා පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට පරිසර විෂය ඇතුළත් කෙරේ.
- විවිධාකාරයේ පාරිසරික හානි දැනුම් දීම සඳහා පැය 24 පුරා දින 365ම ක්‍රියාත්මක මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කෙරේ.
- විවිධ විකෘති ජාන සහිත පරිසර විනාශකාරී ශාක වර්ග හා සත්ත්ව විශේෂ ආදී දේ ලංකාවට ගෙන ඒමට එරෙහි වැඩපිළිවෙල ශක්තිමත් කෙරෙන අතර දැනට ව්‍යාප්ත වූ එවැනි දෑ තුරන් කිරීමට හෝ නිසි පරිදි කළමනාකරණය කිරීමට පියවර ගැනේ.
- අලි මිනිස් ගැටුම ඇතුළු පරිසරය හා මිනිසා ගැටෙන සියලු ප්‍රශ්න සඳහා විද්‍යාත්මක කඩිනම් විසඳුම් ලබා දීමට පියවර ගැනේ.
- අභය භූමිවල ජල ප්‍රශ්නයට විසඳුම් ලෙසින්, සතුන් ගැවසෙන ප්‍රදේශවල ඇති, පසින් ගොඩවීම නිසා ධාරිතාව අවම වී ඇති ජලාශ ප්‍රතිසංස්කරණය කර, වසර පුරාම ජලය රැස්වන සේ වැව් සැකසීම.
- වැසි, සුනාමි, නියං, උෂ්ණත්ව වෙනස්වීම් වැනි විවිධාකාරී පාරිසරික වෙනස්වීම් කල් ඇතුව හඳුනාගත හැකි සහ අදාළ ආයතන සහ ජන කොටස්වලට කල් ඇතිව දැනුම් දිය හැකි තාක්ෂණික පහසුකම් වැඩි දියුණු කරනු ලැබේ.

- අපද්‍රව්‍ය විද්‍යාත්මකව කළමනාකරණය, පළාත් පාලන ආයතනවල අත්හැරිය නොහැකි වගකීමක් බවට පත් කර අවශ්‍ය තාක්ෂණික මග පෙන්වීම් සිදු කරනු අතර ඊට එරෙහිව කටයුතු කරනු ආයතන සම්බන්ධයෙන් නීතිය දැඩිව ක්‍රියාත්මක කරනු ලැබේ.
- වල් බිහිවී ඇති ඉඩම් මෙන්ම ජෛව විවිධත්වයට හානි වන සේ වගා කර ඇති පයිනස්, ටර්පන්ටයින් වැනි වගාවන් වෙනුවට දේශීය කොස්, දෙල්, මී, කුඹුක්, කලුවර වැනි ශාක වගාව මහා පරිමාණයෙන් ව්‍යාප්ත කෙරේ.
- සියලුම සංවර්ධන කටයුතු සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ ක්‍රමය අනිවාර්ය කිරීම.

## කාලයත් පහසුවත් රැකදෙන ප්‍රවාහනයක්

රජයක් විසින් ප්‍රවාහනය විෂයෙහි යටිතල පහසුකම් නංවන විට, එමගින් ඔවුන් කාලය නාස්තිකර දමන ගමනාගමනය සඳහා වැය වන වියදම අඩුකර දැමුවා වෙයි. එය අවිවාදයෙන්ම ජනතාවගේ සතුටට සහ පහසුවට හේතුවන්නේය.

- ප්‍රධාන මාර්ගයට පිවිසීම සඳහා කිලෝමීටර 2කට වැඩි දුරක් ගෙවා යා යුතු ග්‍රාමීය ප්‍රදේශ 1400ක් හඳුනාගෙන තිබේ. ඒ සියළු ග්‍රාමීය ප්‍රදේශ සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව 'මිනි බස්රථ' සැපයීම.
- දුම්රිය සේවාව කඩිනම් පූර්ණ නවීකරණයට ලක් කර එය මගී සහ භාණ්ඩ (විශේෂයෙන්ම කෘෂි, පශු, ධීවර නිෂ්පාදන මෙන්ම ගොඩනැගිලි ද්‍රව්‍ය සහ කාර්මික නිෂ්පාදන) ප්‍රවාහනය සඳහා පුළුල් කෙරේ. ප්‍රධාන නගර තුළ හා ජනාකීර්ණ නගර අතර උමං දුම්රිය සේවා අරඹනු ලැබේ. ඒ සඳහා හැකි උපරිමයෙන් දේශීය මානව හා භෞතික සම්පත් යොදා ගැනේ.
- විශ්‍රාමිකයින් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සහනදායී මිලකට ගමනාගමනයේ යෙදීමට වැඩපිළිවෙලක් සකස් කෙරේ.
- සංචාරක කලාප ඒකාබද්ධ කරමින් බස්, දුම්රිය, නාවික හා ගුවන් සේවා පුළුල් කෙරේ.

- රටේ සංවර්ධනය සමග ඇති වන අනාගත අවශ්‍යතා පදනම් කරගනිමින් නව මාර්ග පද්ධති ඉදි කිරීමත් දැනට පවතින මාර්ග අලුත් වැඩියා කිරීමත්, පළල් කිරීමත් අවශ්‍යතාවය මත රථගාල් ඉදිකිරීම සඳහා පොදු සැලසුමක් තුළ කඩිනම් ක්‍රියාමාර්ග ගැනේ.
- අලුතින් මාර්ග ඉදිකළ පසු හා මාර්ග පුළුල් කළ පසු වෙනත් සේවා අවශ්‍යතා වෙනුවෙන්, උදාහරණ ලෙස විදුලි රැහැන්, ජලනල, දුරකථන රැහැන් මාර්ග කඩා දැමීම සහ කඩතොළු කිරීම නිසා සිදුවන හානිය නාස්තිය සහ අවහිරතා මග හැරවීම සඳහා මාර්ග සකස් කිරීමේ දී එම සේවා සපයන ආයතන සමග ඒකාබද්ධ සැලසුමක් සහිතව කටයුතු කෙරේ.
- සියලු මහා මාර්ග සහ අභ්‍යන්තර මාර්ග වෙතට පයින් ගමන් කරන මගීන්ට ආරක්ෂිතව සහ පහසුවෙන් ගමන් කළ හැකි ආකාරයට පදික වේදිකා සහ පදික මාරු සංවර්ධනය කිරීමට ප්‍රමුඛතාව ලබා දෙයි.
- ප්‍රවාහන ගාස්තු පහළ දැමීම ඉලක්ක කර ගෙන පොදු ප්‍රවාහන සේවාවන්හි යෙදෙන්නන්ට වාහන ආනයනය කිරීමේ දී සහ අමතර කොටස් ආනයනයේ දී බදු සහන ලබා දෙන අතර සහන මිලකට ඉන්ධන ලබා දීමේ ක්‍රමයක් ද ඇති කෙරේ.
- ත්‍රී රෝද රථ හිමියන් හා රියදුරන් මුහුණපාන ගැටලු හා දුෂ්කරතා අවම කිරීමට සහ ඔවුන්ට වෘත්තීය ගරුත්වය ඇතිව කටයුතු කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගැනේ. ඒ සඳහා ප්‍රවාහන අමාත්‍යංශයට අනුබද්ධව ආයතනයක් පිහිටුවේ.
- කොළඹ නගරයට ඇතුළුවන ප්‍රධාන ප්‍රවේශ මාර්ග 6හි උදේ සහ සවස් කාලයේ ඇතිවන අධික රථවාහන තදබදය මගහැරවීම සඳහා වායු සමීකරණය කරන ලද ආසන සංඛ්‍යාවෙන් වැඩි සහ තට්ටු දෙකේ බස්රථ යෙදවීම.
- විදුලියෙන් ක්‍රියාත්මක කරන වාහන සඳහා ආරෝපන මධ්‍යස්ථාන නොමැතිකමින් එම වාහන ව්‍යාප්තිය සීමා වී තිබේ. මෙම තත්වයට විසඳුමක් වශයෙන් එවැනි වාහන සඳහා වූ ආරෝපන මධ්‍යස්ථාන 600ක් රට පුරා පිහිටුවීම. මෙම අවශ්‍යතාව සපුරාලීම සඳහා මේ වන විට කිසිදු නීතියක් මෙරට ක්‍රියාත්මක නොවන අතර ඒ සඳහා අදාළ නීති සම්පාදනය.

- දැනට ඉහළ නංවා ඇති හයිබ්‍රිඩ් වාහන බද්ධ නැවත පෙර තත්ත්වයට ගෙන ඒම.
- තදාසන්න දුම්රිය ස්ථාන සම්පූර්ණයෙන්ම නවීකරණය කර දැනට පවතින මැදිරි 6කින් යුත් දුම්රිය වෙනුවට මැදිරි 15කින් යුත් වැඩි ආසන සංඛ්‍යාවක් සැපයෙන සහ වැඩි මගී පිරිසක් ප්‍රවාහනය කර හැකි දුම්රිය යොදනු ලැබේ.
- දුම්රිය, ලංගම බස් රථ සහ පෞද්ගලික බස්රථවල ගමන් ගන්නා මගියෙක්ට හදිසි අනතුරකින් සිදුවන මරණ සඳහා රුපියල් ලක්ෂ 10ක රක්ෂණ වන්දියක් රජය මගින් ලබාදීම.

## ඉන්දියානු සාගරයේ සංචාරක පාරාදීසය හදමු

ලෝකයා මවිත කරවන වසර දහස් ගණනක් පැරණි ඉතිහාස සාධක විසින් සංචාරකයාට ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ආරාධනා කරනු ලබන්නේය. අති සුන්දර වෙරළ තීරය, රමණීය පරිසරය, අලි ඇතුන්, කොටි වලසුන් ගැවසෙන වනය, කුරුල්ලන් බහුල තෙත් බිම් විදේශ සංචාරකයා වශීකෘත කරන්නේය. දින 365 පුරාම පවතින හිරු එළිය සංචාරකයා සතුටින් නහවන්නේය. එවන් රටක සංචාරක ව්‍යාපාර තිබිය යුත්තේ මෙවන් තැනකද? අපි එය මෙසේ නිසි තැනට ගෙන යන්නෙමු.

- එක් දිනක් තුළ ශ්‍රී ලංකාවට පැමිණෙන ගුවන් යානා සංඛ්‍යාව මේ වන විට 70ක් වන අතර එය 150 දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම. එමගින් මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව වසරකට මිලියන 3ක් දක්වා වැඩිකරගත හැක.
- 'Beautiful SriLanka' නමින් ජංගම දුරකථන වැඩසටහනක් (mobile app) සකසා, සංචාරකයන්ට ශ්‍රී ලංකාව තුළදී ලබාගත් ඡායාරූප මෙම වැඩසටහනට යාවත්කාලීන කිරීමට අවස්ථාව සලසාදීම සහ සෑම සතියකටම වරක් ඉන් හොඳම ඡායාරූපය තෝරා ත්‍යාග පිරිනැමීම.
- සංචාරක පොලිස් මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාව ඉහළ නංවා එය ආසියාවේ ඇති ඉහළම මට්ටමේ සංචාරක පොලිස් සේවාවල සමතැනට පැමිණෙන සේ ප්‍රතිව්‍යුහගත කිරීම. මෙමගින් මෙරටට පැමිණෙන

සංචාරකයන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම. රටට ඇතුල්වන සියලු සංචාරකයින්ට ගුවන් යානයේදී හෝ නැවේදී ඊට සම්බන්ධ විය හැකි දුරකථන සහ ඊමේල් තොරතුරු සැපයේ.

- සංචාරකයින්ගේ සුලු පැමිණිලි වෙනුවෙන් සංචාරකයන් සඳහා උසාවියක් ඇති කිරීම සහ එමගින් පොලීසිය හා අනෙකුත් නීති කටයුතු ක්‍රියාත්මක කිරීමේදී වැය වන කාලය අවම කිරීමට පියවර ගැනේ.
- පහත කාණ්ඩ යටතේ වන සංචාරක කර්මාන්ත දියුණු කිරීම පිණිස විශේෂ අවධානයක් යොදන්නෙමු.
    - ❒ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය
    - ❒ කෘෂිකර්මාන්තය සහ බැඳුණු සංචාරක කර්මාන්තය
    - ❒ විනෝදය සහ විවේකය සමග බැඳුණු සංචාරක කර්මාන්තය
    - ❒ අධ්‍යාපනය පදනම් කරගත් සංචාරක කර්මාන්තය
    - ❒ ත්‍රාසජනක ක්‍රියාකාරකම් පදනම් කරගත් සංචාරක කර්මාන්තය
    - ❒ ශාරීරික සුවතාව, ස්පා සහ ආයුර්වේදය පදනම් කරගත් සංචාරක කර්මාන්තය
    - ❒ පුරවිද්‍යාත්මක සහ උරුමය මත රැඳුණු සංචාරක කර්මාන්තය
    - ❒ සංස්කෘතිකමය සහ ආධ්‍යාත්මික සාධක පදනම් කරගත් සංචාරක කර්මාන්තය
    - ❒ වෙරළාශ්‍රිත සංචාරක කර්මාන්තය
    - ❒ වනජීවී සාධක මත රැඳුණු සංචාරක කර්මාන්තය
- සංචාරකයාට 'සාප්පු සවාරියක' අත්දැකීම වඩාත් පුළුල් ලෙස විඳගැනීමට අවස්ථාව සලසාදෙමින් රටපුරා සංචාරකයා ඉලක්කගත සාප්පු සංකීර්ණ සහ ප්‍රදර්ශනාශාලා මධ්‍යස්ථාන ගොඩනැගීම.

- සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ පෞද්ගලික ප්‍රවාහන සංගම් රියදුරන් සඳහා විධිමත් පුහුණුවක් ක්‍රියාත්මක කිරීම තුළින් සංචාරකයන්ට පහසුවක්, ආරක්ෂාවක් සහ ආචාරශීලී සේවයක් සැපයීම.
- පෞද්ගලික සංචාරක මගපෙන්වන්නන් හට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇතිකිරීම තුළින් ඔවුන්ට ක්ෂේත්‍රය පිළිබඳව වඩා උනන්දුවක් සහ ඇල්මක් ඇතිකිරීම.
- රටේ සංස්කෘතික වටිනාකම් ආචාරධර්ම සහ ස්වභාවික දායාදයන් ආරක්ෂා වන පරිදි හා දේශීය විදේශීය සංචාරක ප්‍රජාව ආකර්ෂණය කරන පරිදි වෙරළ ආශ්‍රිතව, කඳුකරයේ වනෝද්‍යාන ආදී වශයෙන් වන පාරිසරික කලාප සහ පුරාවිද්‍යාත්මක සංචාරක කලාප වෙන් කෙරේ.
- තෝරාගත් විශේෂ සංචාරක කලාප ආශ්‍රිතව දේශීය කර්මාන්ත හා හස්ත කර්මාන්ත වැඩි දියුණු කිරීමටත් වෙළඳපොලවල් ඇති කිරීමටත් පියවර ගැනේ. ඒ යටතේ ආරම්භයක් ලෙස ශ්‍රී ලංකාවට ආවේණික භාණ්ඩ නිෂ්පාදනය කරන ගම්මාන 30 ක් බිහි කෙරේ.
- ශ්‍රී ලංකාවේ ආවේණික කලාවන් පදනම් කරගත් සංචාරක ව්‍යාපාරයක් වර්ධනය කිරීම පිණිස, වෙස්මුහුණු සහ කැටයම් ඇතුළුව සාම්ප්‍රදායික කලා භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොවුන් කලාකරුවන්ගේ වැඩි දායකත්වයක් ලැබෙන පරිදි ඔවුන්ව උනන්දු කර, ඔවුන්ගේ නිර්මාණ උසස් මට්ටමේ කලා ප්‍රදර්ශනසැල් හරහා දේශීය මෙන්ම විදේශීය සංචාරකයන් වෙත අලෙවිකිරීමේ වැඩපිළිවෙලක් සැකසීම.
- සංචාරක කර්මාන්තයට අදාළ රැකියා උසස් වෘත්තීය නිපුණත්වයක් සහිත ඒවා බවට ඉහළ දැමීම සඳහා පාඨමාලාවන් සහිත මධ්‍යස්ථානයක් පළමු වසර තුළ ආරම්භ කෙරේ.
- මෙරට පුරවිද්‍යාත්මක වටිනාකමකින් යුත් සියලු ස්ථානවල විස්තර ඇතුළත් ජංගම දුරකථන වැඩසටහනක් සහ එම පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථානවල තොරතුරු ඇතුළත් ආකර්ෂණීය වෙබ් අඩවියක් ලොව පුරා ක්‍රියාත්මක කරන අතර ඒ සඳහා රජයේ විදේශ සේවාව සහ විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ සහායද උපරිමයෙන් ලබා ගැනේ.

- චීන, ජර්මන්, ඉන්දියානු භාෂා ඇතුළු විවිධ භාෂාවන් ඉගැන්වීම සඳහා අධ්‍යාපන ආයතන රජයෙන් ආරම්භ කෙරේ.
- පාරිසරික සංචාරය වැඩි දියුණු කිරීම පිණිස වන ජීවී උද්‍යාන සහ උද්භිත උද්‍යාන ඒවායේ සුරක්ෂිතභාවය රැකෙන පරිදි ආකර්ෂණීය කිරීමට පියවර ගනු ලබන අතර වනගත සංචාරක කඳවුරු බිහි කිරීම සඳහා ද සැලසුම් සකස් කෙරේ.

## සියල්ලන් දිනවන ක්‍රීඩාවක්

ක්‍රීඩාව යනු වයස් භේදයකින් තොරව සැමගේ ශාරීරික සහ මානසික සුවතාව වෙනුවෙන්ද, සාමුහික හැඟීම වර්ධනය උදෙසාද යොදාගත හැකි සොඳුරු ක්‍රියාකාරකමකි. අද ලෝකයේ බොහෝ රටවල් මේ වටිනාකම හඳුනාගනිමින් ක්‍රියාශීලී මෙන්ම ආතතියෙන් මිදුණු සමාජයක් උදෙසා ක්‍රීඩාව යොදාගනිමින් සිටියි. සමාජයේ සෑම කාණ්ඩයක්ම ක්‍රීඩාවට කැඳවමින් සිටියි. ඒ අතර එවන් රටවල්, අද ක්‍රීඩාව යනු ලොව වැඩිම වටිනාකමකින් යුත් වෙළඳාම් අතරට වැටෙන්නක් සේ සලකා ක්‍රීඩා ආර්ථිකයක් ගොඩනගමින් සිටියි. අප ද ක්‍රියාශීලී, මානසිකව මෙන්ම කායිකවද නිරෝගී ශ්‍රී ලාංකේය ජාතියක් බිහිකිරීම උදෙසාද, මෙතෙක් මෙරටට ආගන්තුක ක්‍රීඩා ආර්ථිකයක් වෙත යෑම උදෙසාද කරුණු පෙළගස්වා ඇත්තේ මෙසේය.

- වෘත්තීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩාවෙන් විශ්‍රාම ගැනීමෙන් පසු විශ්‍රාම වැටුපක් ලබා දීමට කටයුතු කෙරේ.
- සෑම ලියාපදිංචි පාසල් ක්‍රීඩාවක් සඳහාම දිස්ත්‍රික් මට්ටමේ කුසලතා පෙන්වන පාසල් ක්‍රීඩකයන් 1000කට මසකට රුපියල් 2000 බැගින් වූ ක්‍රීඩා ශිෂ්‍යත්ව වැඩපිළිවෙලක් ආරම්භ කෙරේ.
- පාසල් සිසුන් පොතපතට පමණක් සීමා වීම වෙනස් කිරීමටත් ඔවුනගේ ශරීර සුවතාව ඉහළ දැමීමටත් අරමුණු කරමින් සාමාන්‍ය පෙළ විභාගයට විෂයක් ලෙස ක්‍රීඩාවක් අනිවාර්ය කරනු ලැබේ.
- ජාතික මට්ටමේ ක්‍රීඩකයින් ජාත්‍යන්තර තලයට ගෙන ඒම අරමුණු කරගෙන විවිධ ක්‍රීඩා ඉසව් ආවරණය වන සේ වසරකයට ක්‍රීඩකයන් 50කට විදේශීය ක්‍රීඩා පුහුණු ශිෂ්‍යත්ව ලබා දේ.

- ක්‍රීඩාවට දක්ෂකම් ඇති ආබාධිත පුද්ගලයින්ට පළපුරුදු පුහුණුකරුවන් යොදා පුහුණු කර ජාත්‍යන්තර තරග සඳහා පුහුණු කිරීමට පියවර ගැනේ.
- පාසල් මට්ටමේ ක්‍රීඩාව දියුණු කිරීම සඳහා වසරක් තුළ දී පාසල් ක්‍රීඩාංගන 100 ක් සම්පූර්ණ පහසුකම් සහිතව සංවර්ධනය කිරීම සඳහා ක්‍රීඩාංගණයකට රුපියල් මිලියන 50 බැගින් වෙන් කෙරේ.
- අවම වශයෙන් එක් දිස්ත්‍රික්කයකට එකක් වන පරිදි අංග සම්පූර්ණ ක්‍රීඩාංගණයක් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බැගින් පිහිටුවනු ලැබේ.
- සෑම මූලික රෝහලක් ආශ්‍රිතවම ක්‍රීඩා වෛද්‍ය ඒකකයන් පිහිටුවා ක්‍රීඩාවට අදාළ සෞඛ්‍ය සේවාවන් සඳහා අධ්‍යාපනය දෙමව්පියන් ක්‍රීඩකයින් පුහුණුකරුවන් සහ සංවිධායකයින් අතරට ව්‍යාප්ත කිරීමට පියවර ගනු ලැබේ.
- ක්‍රීඩකයන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ තාක්ෂණ ශිල්පීන්, ක්‍රීඩා කළමනාකරුවන්, පුහුණුකරුවන්, තරග සංවිධායකයින්, ක්‍රීඩා උපකරණ නිෂ්පාදකයින්, ක්‍රීඩා මාධ්‍යකාරුවන් ආදීන් නිර්මාණය කරන සහ පුහුණු කරන ක්‍රීඩා සඳහා වෙන් වූ ක්‍රීඩා ජාතික පාසලක් පළමු වසර තුළදී ද ක්‍රීඩා තුළින් වෙන්වූ ජාතික සරසවියක් පළමු වසර තුළ තුළදීද ආරම්භ කෙරේ.

## කලාවට වින්දනයක් - සංස්කෘතියට පෞරුෂයක්

කලාව යනු ජන මනසේ සුන්දරත්වය පිළිබඳ නිදර්ශනයක් වැනිය. සංස්කෘතිය යනු සමාජයට පරම්පරාවෙන් උරුම වූ පෞරුෂයකි. කලාවෙන් මිදුණු සමාජය වියළිය. නීරසය. චණ්ඩය. සංස්කෘතිය අමතක කළ සමාජය සංකරය, චංචලය. පරාධීනය. කලාව සමාජයේ රසවත් හා හරවත් වින්දනයක් දෙසටද, සංස්කෘතිය සමාජීය හරපද්ධතියේ මෙවලම ලෙසින්ද යොදාගන්නා අපේ වැඩ පිළිවෙල මෙසේ වන්නේය.

- සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුලු සියලු ජනතාවගේ කලා හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර පෝෂණය කරනු අතර ඒවා මගින් ජනතාව අතර මිත්‍රත්වය, සහෝදරත්වය සහ සමගිය ගොඩනැගීම සඳහා කටයුතු කෙරේ.

- කලා නිර්මාණකරුවන්ගේ අයිතිය තහවුරු කිරීම සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාංශය බල ගැන්වේ.
- රූපවාහිනිය, නාට්‍යය, චිත්‍ර, මූර්තී ආදී කලා මාධ්‍යය සඳහා විධිමත් පුහුණුවක් ලබා දීමෙන් පුහුණු ආයතන බිහි කරන අතර ආරම්භයක් ලෙස පළමු වසර තුළ එවැනි ආයතන දෙකක් ස්ථාපිත කෙරේ. ජාත්‍යන්තර මට්ටමේ රංග කලා සහ චිත්‍රපට අභ්‍යාස විද්‍යාලයක් ආරම්භ කෙරේ.
- නාට්‍ය කලාව ජනතාව අතරට ගෙන යෑම අරමුණු කර ගනිමින් ප්‍රාදේශීය මට්ටමින් නාට්‍ය හා රංග ශාලා ගොඩනැගීමට කටයුතු කෙරේ.
- චිත්‍ර ප්‍රදර්ශන පැවැත්වීම සඳහා දැනට කොළඹට සීමා වී ඇති ප්‍රදර්ශන ශාලාවට අමතරව පළාත් මට්ටමින් ප්‍රදර්ශන ශාලා ඉදිකරන අතර චිත්‍ර ශිල්පීන්ට ඒවා ඉතා සහන මිලකට ලබා දේ.
- අන්තර්ජාතික හා ජාතික චිත්‍ර තරගයක් හා ප්‍රදර්ශනයක් වාර්ෂිකව පැවැත්වේ.
- කලාකරුවන් උදෙසා ජීවිත රක්ෂණ ක්‍රමයක්, සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් මෙන්ම ජ්‍යෙෂ්ඨ කලාකරුවන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම.
- සාහිත්‍ය සහ අනෙකුත් කලා කෘති නිර්මාණය පිණිස කලාකරුවන්ට අඩුපොලී බැංකු ණය පිරිනැමේ.
- නවක කලාකරුවන් සිනමාකරුවන් සහ වේදිකා නාට්‍ය නිර්මාණකරුවන්ගේ නිර්මාණ එළි දැක්වීමට රාජ්‍ය ආයතන සතු රංග ශාලා සහන මිලට ලබා දෙයි.
- ශ්‍රී ලංකාවේ ඓතිහාසික උරුමයන්, පෞරාණික ස්ථාන සහ භාණ්ඩ සංරක්ෂණය කිරීම, ඒවායේ තිරසාර පැවැත්ම තහවුරු කිරීම සහ අනාගත පරපුර උදෙසා ඒවා ජාතික උරුමයන් ලෙස සුරැකීම රජයේ ප්‍රමුඛ වගකීමක් බවට පත් කෙරේ.
- පුරා වස්තු වැනසීමේ අපරාධකාරී ක්‍රියාවලිය මුළුමනින්ම නතර කිරීමට වහාම පියවර ගැනේ.

# ජනතාවාදී ආණ්ඩුවක්, ප්‍රියමනාප රාජ්‍ය සේවයක්

"ආණ්ඩුවක කාර්යභාරය වනුයේ ජනතාවට සතුට ළඟාකරදීමය. ජනතාවට සේවය කරමින් එකම අරමුණක් එල්ලයේ වැඩකිරීමය. අනාගතයේ බිහිවන ආණ්ඩු ගැන කථා කිරීමේදී ජනතා විමුක්ති පෙරමුණ විසින් විශේෂ කොට දක්වනු ලබන්නේ අපි ජනතාවගේ පහසුව තකා සේවාවන් සපයන්නේ කෙසේද යන්නයි. සැබෑ නායකයා යනු ඔහුගේ කණ්ඩායමට ශක්තිය සහ හැකියාව කැඳවිය හැකි සතුටුදායක තත්ත්වයන් නිර්මාණය කළ හැකි පුද්ගලයාය. ශ්‍රේෂ්ඨ නායකයකු විසින් තවත් ශ්‍රේෂ්ඨ නායකයන් රැසක් බිහි කරනු අතර සිය ජනතාවගේ යහපත සලකා නායකත්වය සේවාවක් ලෙස දකින අයෙකි. රාජ්‍ය පාලනය හා සේවය යනු අතිශයින් ගාම්භීර වගකීමකි. රටවැසියා උදෙසා සොඳුරු සත්කාරයක් කළ හැකි මගකි. රටෙහි දිශානතිය පිළිබඳ තීරණාත්මක සාධකයකි.

ජනතාවාදී ආණ්ඩුවක් සහ ප්‍රියමනාප රාජ්‍ය සේවයක් වෙනුවෙන් නිවැරදි දේශපාලන පක්ෂයක් ජයග්‍රහණය කිරීමේ වගකීම පවතින්නේ ජනතාව වෙතය. එම වගකීම ඔබ ඉතාම නිවැරදිව ඉටු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු."

----උපුටා ගැනීම පිටුව 23 -----

**ජනතා විමුක්ති පෙරමුණ**

**"සතුටින් සිටිය හැකි රටක්"**

[illegible]